# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,904 — 1970 අප්‍රේල් 30 වැනි බ්‍රහස්පතින්දා — 1970.4.30

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාගයකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — | ආණ්ඩුවේ නිවේදන ... ... ... | 340 |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය ... ... | 337 | මිළ පාලන දැන්වීම් ... ... ... | — |
| රාජ්‍ය සේවා කොමිසන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | — | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | 338 | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| වෙනත් පත් කිරීම් ආදිය ... ... ... | 340 | ආණ්ඩුවේ වස්තුව හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... ... | — | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 345 |
| | | "සුරාබිදු ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... ... | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය

### 1970 අංක 148

අංකය : ඩී. 21/ආර්ඊසී/412.

**යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක් හා විශ්‍රාම ගැනීමක්**

**උසස් කිරීම**

පහත නම් සඳහන් නිලධාරියා 1969 ජූනි මස 20 වැනි දින සිට මේජර් වශයෙන් :—

කපිතාන් (තාවකාලික මේජර්) රංජන් උපාලි ද සිල්වා සේනානායක, ට. ස. ස. බ.

**විශ්‍රාම ගැනීම**

පහත නම් සඳහන් නිලධාරියා 1970 ජූනි මස 1 වැනි දින සිට යුද්ධ හමුදා ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගත්තාවූ ඇත :—

මේජර් රංජන් උපාලි ද සිල්වා සේනානායක, ට. ස. ස. බ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඩබ්ලිව්. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
වැඩ බලන ස්ථිර ලේකම්.

1970 අප්‍රේල් මස 19 දින,
කොළඹ දී ය.

4-974

---

සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

**විශේෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් භාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි දැන්වීම්දෙන්නන්ගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

ඇල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1970 අංක 149

අංකය : සී/වීඑප්/34 (සී).

## යුද්ධ හමුදාව—ලංකා ස්වේච්ඡා බලසේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම්

1970 මාර්තු මස 16 වැනි දින සිට ලුතිනන්වරුන් වශයෙන් :—

දෙවන ලුතිනන් ඉමදූව ගමගේ ජෝර්ජ් සමරවික්‍රම, ලයුපුබ.

දෙවන ලුතිනන් ආරච්චිගේ දොන් ජෝසප් පැට්‍රික් සුරවීර, ලයුපුබ.

දෙවන ලුතිනන් මුතුවාඩිගේ ජස්ටින් අල්විස්, ලයුපුබ.

දෙවන ලුතිනන් සාලිය අසෝක කුලතුංග, ලයුපුබ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඩබ්ලිව්. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
වැඩ බලන ස්ථිර ලේකම්.

1970 අප්‍රේල් මස 19 දින,
කොළඹ දී ය.

4-972

---

1970 අංක 150

අංකය : සී./වීඑප්/17/ඒ/(VI).

## යුද්ධ හමුදාව—ලංකා ස්වේච්ඡා බලසේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම් හා ද්විතීයනය කිරීම්

### පත් කිරීම්

1969 ඔක්තෝබර් මස 1 වැනි දින සිට පහත සඳහන් මහත්වරුන්ව පිළිවෙලින් ජ්‍යෙෂ්ඨත්වය ඇතිව, ලංකා ශිෂ්‍ය භට බලකායේ දෙවන ලුතිනන් වරුන් වශයෙන් :—

වනසිංහ මුදියන්සේලාගේ අමරදාස මහතා
පුංචි බණ්ඩා කහවත්ත මහතා
උදයරත්න ධර්මසිරි වාරියප්පෙරුම මහතා
මොරදගේ ලයනල් සෙනෙවිරත්න මහතා
අත්වාරම වියන්නලාගේ අශෝක කරුණානන්ද මහතා
බෙන්තරගේ එඩ්වඩ් පෙරේරා මහතා
මෙරිල් මාර්ටින් අමුගොඩ මහතා
ජයසිංහ ගුරුන්නැහැලාගේ විල්බට් ජයසිංහ මහතා
කලුබෝවිලගේ දොන් චන්ද්‍රසිරි මහතා
ගිනිගත්පිටියේ සේතුංග මුදියන්සේලාගේ සිරිවිජය බණ්ඩාර මහතා
ආනන්ද පියසේන විජේකෝන් මහතා
පතිරගේ ස්ටීවන් මහතා
යද්දෙහිගේ සරත් රාජේන්ද්‍ර ප්‍රේමතිලක පෙරේරා මහතා
ගාල්ලගේ දොන් ආයුපාල මහතා

### ද්විතීයනය කිරීම්

1969 ඔක්තෝබර් මස 1 වැනි දින සිට පහත නම් සඳහන් ලංකා ශිෂ්‍ය භට බලකායේ නිලධාරීන්ව සේවය සඳහා එම බලකායේ කණිෂ්ඨ කොටසට ද්විතීයනය කරන ලදී :—

දෙවන ලුතිනන් වනසිංහ මුදියන්සේලාගේ අමරදාස
දෙවන ලුතිනන් පුංචි බණ්ඩා කහවත්ත
දෙවන ලුතිනන් උදයරත්න ධර්මසිරි වාරියප්පෙරුම
දෙවන ලුතිනන් මොරදගේ ලයනල් සෙනෙවිරත්න
දෙවන ලුතිනන් අත්වාරම වියන්නලාගේ අශෝක කරුණානන්ද
දෙවන ලුතිනන් බෙන්තරගේ එඩ්වඩ් පෙරේරා
දෙවන ලුතිනන් මෙරිල් මාර්ටින් අමුගොඩ
දෙවන ලුතිනන් ජයසිංහ ගුරුන්නැහැලාගේ විල්බට් ජයසිංහ
දෙවන ලුතිනන් කලුබෝවිලගේ දොන් චන්ද්‍රසිරි
දෙවන ලුතිනන් ගිනිගත්පිටියේ සේතුංග මුදියන්සේලාගේ සිරිවිජය බණ්ඩාර
දෙවන ලුතිනන් ආනන්ද පියසේන විජේකෝන්
දෙවන ලුතිනන් පතිරගේ ස්ටීවන්
දෙවන ලුතිනන් යද්දෙහිගේ සරත් රාජේන්ද්‍ර ප්‍රේමතිලක පෙරේරා
දෙවන ලුතිනන් ගාල්ලගේ දොන් ආයුපාල

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඩබ්ලිව්. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
වැඩ බලන ස්ථිර ලේකම්.

1970 අප්‍රේල් මස 19 දින,
කොළඹ දී ය.

4-976

---

1970 අංක 151

අංකය : සී. 22/ආර්සීඑන්/163.

## රාජකීය ලංකා නාවික හමුදාව—නිත්‍ය නාවික බලකා—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුම කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරියා 1970 ජූනි මස 1 වැනි දින සි රාජකීය ලංකා නාවික හමුදාවේ නිත්‍ය නාවික බලකායෙන් විශ් ගන්නවා ඇත :—

උප ලුතිනන් (වි) ඒ. එෆ්. පී. fපර්ඩිනන්ඩ්ස්, රා. ලං. නා. භ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඩබ්ලිව්. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
වැඩ බලන ස්ථිර ලේකම්.

1970 අප්‍රේල් මස 19 දින,
කොළඹ දී ය.

4-973

---

# අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය

1970 අංක 152

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කි කර ඇත්තේ ය :—

අංකය : ජේඑම්/ජී. 40/66.

ටී. ඒ. විජේකුලසූරිය මහතා 1970 අප්‍රියෙල් මස 23 වන දින සි නැවත නියෝගයක් කරන තෙක් අතිරික්ත නිලධාරියෙ වශයෙන් සහ අවිස්සාවේල්ල අතිරේක මහෙස්ත්‍රාත් තැන, ල මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැ සහ අවිස්සාවේල්ල අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙ පත් කර ඇත.

අංකය : ජේඑම්/ජී. 40/66.

එම්. පී. සී. රත්නම් මහතා නිවාඩු පිට සිටින තෙක් හෝ නැ නියෝගයක් කරන තෙක්, වී. එන්. ඒ. ඩබ්ලිව්. වික්‍රමසූ මහතා 1970 අප්‍රේල් මස 16 වන දින සිට 1970 අප්‍රේල් ම 27 වන දින තෙක් බම්බලපිටියේ පිහිටි උසාවියේ ක්‍රියා කර කොළඹ ළමා මහෙස්ත්‍රාත් වශයෙන් වැඩ බැලීමට සහ ගම්ප මීගමුව සහ පානදුරේ අතිරේක ළමා මහෙස්ත්‍රාත් වශයෙන්.

අංකය : ජේඒ/16 බී/69.

ජී. එෆ්. එච්. අතුරුපාන මහතා ඔහුගේ වෙනත් රාජකාරිව අතිරේක වශයෙන් බම්බලපිටියේ ළමා උසාවියේ අංක 10 දරණ නඩුව ඇසීමට සහ අසා අවසන් කර තීන්දුව දීම පිණ 1970 අප්‍රෙල් මස 19 දින සිට කොළඹ අතිරේක ළමා මහෙස්ත්‍ර වශයෙන්.

අංකය : ජේඑල්/එස්. 34/67.

ජේ. සී. ඒ. සී. එම්. එස්. සිල්වා මහතා නැති අතර හෝ නැ නියමයක් කරනතුරු, සී. බී. රණසිංහ මහතා 1970 අප්‍රේල් ම 11 සහ 12 දිනයන්හි ගම්පහ අතිරේක මහෙස්ත්‍රාත් තැ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැ සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/එස්. 28/63

කේ. වී. සවර්ණාධිපති මහතා නැති අතර හෝ නැවත නියමය කරනතුරු, එච්. බී. පෙරේරා මහතා 1970 අප්‍රේල් මස දින සිට 11 දින දක්වා කුරුණෑගල අතිරේක මහෙස්ත්‍රාත් තැ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාග මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අති දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/අයි. 1/51

අයි. එම්. ඉස්මයිල් මහතා නැති අතර හෝ නැවත නියමය කරනතුරු, කේ. ටී. කදිර්ගාමලිංගම් මහතා 1970 අප්‍රේල් 18 දින සිට 20 දින දක්වා යාපනේ අතිරේක දිස්ත්‍රික් නඩු තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙ ත්‍රාත් තැන සහ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන වශයෙ

අංකය : ජේඑල්/පී. 6/65.

ආර්. පරමකුරු මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, කේ. ඊ. කදිර්ගාලමලිංගම් මහතා 1970 ජනවාරි මස 18 දින සිට 21 දින දක්වා යාපනේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඒ. 12/65.

ටී. එන්. අබේවීර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, කේ. වී. එම්. සුබ්‍රමානියම් මහතා 1970 අප්‍රේල් මස 18 දින සිට 23 දින දක්වා කල්මුනේ ක්‍රියා කරන මඩකලපුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/සී. 26/63

එම්. ඊ. ධර්මවර්ධන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එස්. සුරවීර මහතා 1970 අප්‍රේල් 6 වැනි දින සිට 9 දින දක්වා කෑගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/සී. 29/66.

ආර්. එල්. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එන්. ජේ. වී. කුරේ මහතා 1970 අප්‍රේල් මස 4 සහ 5 දිනයන්හි කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩබ්ලිව්. 10/65.

සී. සී. ඩබ්ලිව්. වික්‍රමසේකර මහතා නැති අතර හෝ නැවත නියම යක් කරනතුරු, එස්. මතවරාජා මහතා 1970 අප්‍රේල් මස 4 දින සිට 7 දින දක්වා ත්‍රිකුණාමලයේ අතිරේක දිස්ත්‍රික් නඩු කාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, ත්‍රිකුණාමලයේ ළමා මහෙස්ත්‍රාත් තැන සහ අනුරාධපුර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/එච්. 2/57.

එම්. ඒ. එම්. හුසේන් මහතා නැති අතර හෝ නැවත නියම යක් කරනතුරු, ජේ. එස්. රාජපක්ෂ මහතා 1970 අප්‍රේල් මස 22 සහ මැයි මස 11 දිනයන්හි හලාවත සහ පුත්තලමේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොම සාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඒ. 11/65.

ජේ. ජී. ආසිර්වාදම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, පී. ජී. ද සිල්වා මහතා 1970 අප්‍රේල් මස 9 දින සිට 16 දින දක්වා අවිස්සාවේල්ල අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ජී. 7/57

කේ පාලකිඩ්නර් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. එම්. අබුතහිර් මහතා 1970 අප්‍රේල් මස 8 සහ 9 දිනයන්හි පුත්තලමේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අති රේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/සී. 30/66.

ජී. සී. ඩබ්ලිව්. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියම යක් කරනතුරු, සී. සේරසිංහ මහතා 1970 අප්‍රේල් මස 12 දින සිට 22 දින දක්වා තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස් ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ හම්බන්තොට අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/සී. 25/63.

ඩබ්ලිව්. පී. එන්. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියම යක් කරනතුරු. සී. බී. රණසිංහ මහතා 1970 අප්‍රේල් මස 16 දින ගම්පහ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ ගම්පහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩබ්ලිව්. 11/64.

එස්. ජේ. සී. ද එස්. විජයරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එස්. එච්. අබේසේකර මහතා 1970 අප්‍රේල් මස 18 සහ 19 දිනයන්හි බදුල්ලේ අතිරේක මහෙස් ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/එස්. 35/67.

එච්. ඩබ්ලිව්. සේනානායක මහතා නැති අතර හෝ නැවත නියම යක් කරනතුරු, ටී. එස්. බූල් මහතා 1970 අප්‍රේල් මස 10 දින හම්බන්තොට අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික් වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ තංගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/එස්. 33/67.

එස්. සයිමන් සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එම්. එච්. කරීම් මහතා 1970 අප්‍රේල් මස 12 වැනි දින නාරාහේන්පිට උසාවියේ ක්‍රියා කරන කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/සී. 28/65.

ජී. ජී. ඩී. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ඩබ්ලිව්. ජේ. පොන්සේකා මහතා 1970 අප්‍රේල් මස 12 දින සිට 16 දින දක්වා පානදුර අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩබ්ලිව්. 16/69.

ඊ. ඒ. විජේකුලසූරිය මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, පී. විජයරත්නම් මහතා 1970 අප්‍රේල් මස 12 දින සිට 15 දින දක්වා නුවරඑළියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස් ත්‍රාත් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ හැටන්හි ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/එම්. 13/69.

ඒ. එච්. ඊ. මොලමූරේ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එස්. බී. සංගක්කාර මහතා පොලොන්නරුවේ ක්‍රියා කරන අනුරාධපුර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන සහ ත්‍රිකුණාමලයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/එම්. 11/62.

සී. ඊ. මෙන්ඩිස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. ඊ. සී. පෙරේරා මහතා 1970 අප්‍රේල් මස 10 දින කොළඹ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, අති රේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ දෙහිවල ගල්කිස්ස අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩබ්ලිව්. 15/69.

එල්. එච්. ජී. වීරසේකර මහතා නැති අතර හෝ නැවත නියම යක් කරනතුරු, රෙක්ස් වික්‍රමසිංහ මහතා 1970 අප්‍රේල් මස 18 දින ගාල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික් වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ඩබ්ලිව්. 15/69.

එල්. එච්. ජී. වීරසේකර මහතා නැති අතර හෝ නැවත නියම යක් කරනතුරු, එම්. එල්. එන්. වික්‍රමසිංහ මහතා 1970 අප්‍රේල් මස 14 සහ 15 දිනයන්හි ගාල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්,

අංකය : ජේඑල්/ආර්. 12/57.

පී. බී. රඹුක්වැල්ල මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, බී. සී. ඊ. වී. කරුණාරත්න මහතා 1970 අප්‍රේල් මස 12 දින සිට 19 දින දක්වා මීගමුවේ අතිරේක මහේස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහේස්ත්‍රාත් තැන, ළමා මහේස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/ආර්. 12/57.

පී. බී. රඹුක්වැල්ල මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එෆ්. ඩබ්ලිව්. ගුණරත්න මහතා 1970 අප්‍රේල් මස 20 දින සිට 23 දින දක්වා මීගමුවේ අතිරේක මහේස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහේස්ත්‍රාත් තැන, ළමා මහේස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : පීඑල්/බී. 8/59.

එෆ් ජී. බී. පෙරේරා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ඒ. එෆ්. එච්. ද අල්විස් මහතා 1970 මාර්තු මස 13, 14 සහ 16 වැනි දිනයන්හි ගාල්ල දිස්ත්‍රික්කයේ ගඟබොඩ හිනිදුම් පත්තු, ගම්බද උසාවි සභාපති සහ වැල්ලබඩ පත්තු අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල් ආර්. 6/67.

එස්. රාජනාදන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එම්. එච්. එම්. ජෝපර් මහතා 1970 මාර්තු මස 31 වෙනි දින කල්මුනේ දිස්ත්‍රික්කයේ, පානම සහ අක්කරෙයිපත්තු ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එස්. 17/68.

ඒ. එම්. අයි. සහිඩ් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ආර්. වී. විල්වරාජා මහතා 1970 මාර්තු මස 31 වැනි දින සහ අප්‍රේල් මස 1 වැනි දිනයන්හි වවුනියාව සහ යාපනය දිස්ත්‍රික්කයන්හි වවුනියාවේ උතුර සහ මුහුදුබඩ පත්තු ගම්බද උසාවි සභාපති සහ පූනාකාරි තුන්නුකායි අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එස්. 16/62.

කේ. ෂන්මුගනාදන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, කේ. කනපතිපිල්ලේ මහතා 1970 පෙබරවාරි මස 10, 11, 12 සහ 13 වැනි දිනයන්හි පේදුරුතුඩුව දිස්ත්‍රික්කයේ තෙන්මරච්චි පච්චිලයිප්පලෙයි, කරච්චි සහ පූනාකාරි තුන්නුකායි ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ගු. 2/48.

ජේ. ඩබ්ලිව්. බී. උදලාගම මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, සී. එල්. ශ්‍රෝ මහතා 1970 මාර්තු මස 28 වැනි දින සහ 31 දිනයන්හි කෑගල්ල දිස්ත්‍රික්කයේ ගල්බඩ කිනිගොඩ බෙලිගල් සහ පරනකුරු කෝරලයන්හි ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

සිරිමෙවන් අමරසිංහ,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 අප්‍රේල් මස 23 දා,
කොළඹ 12,
තැ. පෙ. අංක 573,
අධිකරණ සේවා කොමිෂන් සභා කායාීලයේ දී.

4-977

---

# වෙනත් පත් කිරීම් ආදිය

**1970 අංක 153**

අංකය : සී. 251/ආර්සීඑන්/2.

**රාජකීය ලංකා නාවික හමුදාව—නිලධාරීන්ගේ උසස් කිරීම්**

1969 අගෝස්තු මස 1 වැනි දින සිට ලුතිනන් (වි) පදවියට :—

උප ලුතිනන් (වි) ඊ. එම්. එස්. එදිරිසිංහ, රා. ලං. නා. හ.

ජී. වී. පී. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 අප්‍රේල් මස 9 දින,
කොළඹ දී ය.

4-975

**1970 අංක 154**

පා 4/සැජි 14/131, පා 4/සාම් 9/154, පා 4/සාම් 14/120, පා 4/සාම් 3/138, පා 4/සාම් 20/161, පා 4/සාම් 2/297, පා 4/සාම් 14/117, පා 4/සාම් 14/118, පා 4/සාම් 16/89, පා 4/සාම් 41/13, පා 4/සාම් 3/63, පා 4/සාම් 3/17, පා 4/සාම් 3/73, පා 4/සාම් 16/102.

## අධිකරණ ආඥාපනත

**82 වන වගන්තිය යටතේ දැන්වීම**

6 වන අධිකාරය වූ) අධිකරණ ආඥාපනතෙහි 82 වන වගන්තිය යටතේ මා වෙත පැවරුණු බලතල ප්‍රකාර, අධිකරණ ඇමති, ඇලෙක් සැන්ඩර් ෆේපයාර්ලි විජේමාන්න වන මම :—

1. විලියම් ඇන්ඩර්සන් දිසානායක මහතා ගාල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,
2. හමීඩ් ලෙබ්බේ මොහමඩ් හනීෆා මහතා මහනුවර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
3. සුවාදිරිස් හේවාවසන් ජයසිංහ මහතා ගාල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
4. නීතිඥ ලක්සිරි ගාමණී කහටපිටිය මහතා කළුතර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු සහ නිලතොලත් මහේස්ත්‍රාත්වරයෙකු වශයෙන් ද,
5. මයිල්වාග්නම් කණගරත්නම් මහතා මඩකලපුව අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
6. අහමදාලි ලෙබ්බෙ මොහමඩ් කියාස් මහතා ගම්පහ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
7. ඇග්නස් මෝඩ් ලෙකම්වසම් මහත්මිය ගාල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරියක වශයෙන් ද,
8. රූබි වික්‍රමරත්න මදනායක මෙනවිය ගාල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරියක වශයෙන් ද,
9. පැලෑන වඩුගේ සිරිසේන මහතා මාතර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
10. සයිබු කන්ඩු උදුමා ලෙබ්බේ මහතා මඩකලපුව අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
11. හෙන්ද්‍රික් පෙරේරා රත්නායක වෛද්‍යසේකර මහතා කළුතර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
12. අසුරමුනි ආගිලිස් ද සිල්වා වෛද්‍යරත්න මහතා කළුතර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
13. සීමන් හේවාගේ පියුඩර් වික්‍රමසිංහ මහතා පානදුර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද,
14. දොන් දිනෙස් දහනායක යාපා මහතා මාතර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද

පත් කරමි.

ඒ. එෆ්. විජේමාන්න,
අධිකරණ ඇමති.

1970 අප්‍රේල් 22 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

4-983

---

# ආණ්ඩුවේ නිවේදන

**1946 සහ 1947 ලංකා (ආණ්ඩුක්‍රම සහ ස්වාධීනතා) රාජාඥා**

**55 (4) වැනි වගන්තිය යටතේ ආඥාව**

1946 සහ 1947 ලංකා (ආණ්ඩුක්‍රම සහ ස්වාධීනතා) රාජාඥාවල 55 (4) වැනි වගන්තිය යටතේ ආඥාවයි.

සිරිමෙවන් අමරසිංහ,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 අප්‍රේල් 3 වැනි දින,
කොළඹදීය.

**ආඥාව**

දිස්ත්‍රික් විනිශ්චයකාරවරුන්ගේ, රික්වෙස්ට් කොමසාරිස්වරුන්ගේ සහ මහේස්ත්‍රාත්වරුන්ගේ වැඩ බැලීම සඳහා පත් කිරීමේ බලය පහත සඳහන් සීමාවන්ට යටත්ව ලේකම් වෙත මෙයින් පවරනු ලැබේ :—

(1) වරකට දින හතකට වැඩි කාලයක් හෝ එක් මාසයකදී සාමූහික වශයෙන් දින හතකට වැඩියෙන් වැඩ බැලීමට පත් කිරීම් ලේකම් තැන විසින් කළ යුතු නොවේ.

(2) කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය නොමැතිව දින හතක් නිවාඩු දීර්ඝ කිරීම ලේකම් තැන විසින් නොකළ යුතුයි. එසේකුදු වුවත් හදිසි අසනීපයකදී හෝ වෙනත් හදිසි සිදුවීමකදී කොමිෂන් සභාවේ අදහස් විමසා එකී අනුමැතිය ලබා ගන්නා තෙක් එවැනි නිවාඩු දීර්ඝ කිරීමක් ලේකම් තැනට කළ හැක.

2. ගම්බද උසාවි සභාපතින්ගේ වැඩ බැලීම සඳහා පත්කිරීමේ බලය පහත සඳහන් සීමාවන්ට යටත්ව ලේකම්තැන වෙත මෙයින් පවරනු ලැබේ :—

(1) වරකට දින තිහකට වැඩි කාලයකට වැඩ බලන පත්කිරීම් ලේකම්තැන විසින් කළ යුතු නොවේ.

(2) කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය නොමැතිව දින තිහක නිවාඩු දීර්ඝ කිරීමට ලේකම්තැන විසින් නොකළ යුතුයි. එසේකුදු වුවත් හදිසි අසනීපයකදී හෝ වෙනත් හදිසි සිදුවීමකදී කොමිෂන් සභාවේ අදහස් විමසා එකී අනුමැතිය ලබා ගන්නා තෙක් එවැනි නිවාඩු දීර්ඝ කිරීමක් ලේකම් තැනට කළ හැක.

3. මේ ආඥාවේ—

"කොමිෂන් සභාව" යනුවෙන් අදහස් කරන්නේ අධිකරණ සේවා කොමිෂන් සභාවයි. "ලේකම්තැන" යනුවෙන් අදහස් කරන්නේ කොමිෂන් සභාවේ ලේකම් තැනයි.

4-934

---

එල්.ඩී.බී. 132/29

## රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථ සාධක සංගම් ආඥාපනත

(283 වැනි අධිකාරය වන) රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථ සාධක සංගම් ආඥාපනතේ 16 වන වගන්තිය යටතේ රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථ සාධක සංගමය විසින් පනවා, එම වගන්තිය මගින් මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල අනුව ඔහු විසින් ස්ථිර කරන ලද ව්‍යවස්ථාව.

ඇම්. රාජේන්ද්‍ර,
මුදල් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 අප්‍රේල් මස 17 දින,
කොළඹ.

ව්‍යවස්ථාව

1892 ජූනි 17 වන දින අංක 5,147 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද හා වරින් වර සංශෝධනය කරන ලද ව්‍යවස්ථා තවදුරටත් පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

II වන පරිච්ඡේදය—රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථ සාධක සංගමයේ අතිරික්ත අරමුදල් නිවාස හා ඉඩම් ණයවල ආයෝජනය කිරීමේ ව්‍යවස්ථා

(අ) එකී 5(1) වන ව්‍යවස්ථාවෙහි—

(i) "වර්ෂයකට සියයට 7½" යන යෙදුම වෙනුවට "වර්ෂයකට සියයට 10" යන යෙදුම ආදේශ කිරීමෙන්.,

(ii) එකී වූ අතුරු විධානයේ "වර්ෂයකට සියයට 6" යන යෙදුම වෙනුවට "වර්ෂයකට සියයට 8" යන යෙදුම ආදේශ කිරීමෙන්.,

(ආ) (i) එකී 5(ii) වැනි ව්‍යවස්ථාව 5(iii) වැනි ව්‍යවස්ථාව ලෙස යළි අංක යෙදීමෙන්.,

(ii) 5(i) වැනි ව්‍යවස්ථාවට ඉක්බිතිව ම පහත දක්වෙන අලුත් ව්‍යවස්ථාව ඇතුළත් කිරීමෙන් :—

"(ii) (i) වැනි ඡේදයේ කුමක් අඩංගු වුව ද ඒ නොතකා, තත් කාලයෙහි ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කරනු ලබන පොලී ප්‍රමාණයට අනුකූලව පොලී ප්‍රමාණය වෙනස් කිරීමේ බලය කාර්‍යාධිකාරී කාරක සභාව සතු විය යුතු ය"., සහ

(ඇ) එසේ යළි අංක යෙදූ 5(iii) වැනි ව්‍යවස්ථාවෙහි "(i) වැනි ඡේදය යටතේ අයකර ගත යුතුය" යන වචන වෙනුවට, "(i) වැනි ඡේදය යටතේ හෝ (ii) ඡේදය යටතේ නිශ්චය කරනු ලබන පරිදි අය කර ගත යුතු ය" යන වචන ආදේශ කිරීමෙන්.

4-859

---

එල් ඩී—බී. 15/36

## බන්ධනාගාර ආඥාපනත

### 35(1) වැනි වගන්තිය යටතේ නිවේදනය

(54 වැනි අධිකාරය වන) බන්ධනාගාර ආඥාපනතෙහි 35(1) වැනි වගන්තියෙන්, මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ ඇමති, ඇලෙක්සැන්ඩර් ෆේයාර්ලි විජේමාන්න වන මම, කොළඹ නව මැගසින් බන්ධනාගාරය සඳහා ප්‍රාදේශීය පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් පත් කරන ලවදු, ඉල්ලා අස්වූ දොස්තර එච්. ස්ටැන්ලි පීරිස් මහතා වෙනුවට 1970 පෙබරවාරි 26 වැනි දින ආරම්භ වන එක් වර්ෂයක කාලයක් සඳහා, ඩබ්ලිව්. ජෝන් සිල්වා මහතා, මෙයින් පත් කරමි.

ඒ. එෆ්. විජේමාන්න,
අධිකරණ ඇමති.

1970 අප්‍රේල් මස 19 වැනි දින,
කොළඹ දී ය.

4-927

---

## සමිති ආඥාපනත

(123 වැනි අධිකාරය වන) සමිති ආඥාපනතෙහි 3 වැනි සහ 4 වැනි වගන්තිවලින් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර, වාණිජ සහ වෙළඳ ඇමති, වර්ණකුලසූරිය ඉව්වාම්පුල්ලිගේ හියු ප්‍රනාන්දු වන මම මේ නිවේදනයෙන්—

(අ) "සීමාසහිත අධ්‍යාපන සංවර්ධන සංගමය" යන නමින් යුත් සමිතිය ආරම්භ කරනු ලැබූ පරමාර්ථය ඒ ආඥාපනතෙහි බලතල හා පහසුකම් ව්‍යාප්ත කළයුතු පරමාර්ථයක් වශයෙන් නියම කරමි; තවද

(ආ) ලියා පදිංචි කළයුතු නම්, සමිතියකට යටත් පිරිසෙයින් රුපියල් දහ දාහක සහභාග ප්‍රාග්ධනයක් තිබිය යුතුයයි නියම කෙරෙන ඒ ආඥාපනතේ 5 (1) වැනි වගන්තියේ විධිවිධාන වලින් සහ 5 (4) වැනි වගන්තියෙන් එකී සමිතිය නිදහස් කිරීමෙන් ඒ ආඥාපනත අදාළ කිරීම එකී සමිතියට සීමා කරමි.

හියු ප්‍රනාන්දු,
වාණිජ සහ වෙළඳ ඇමති.

1970 අප්‍රේල් මස 19 දින,
කොළඹ දී ය.

4-932

---

## සමිති ආඥාපනත

(123 වැනි අධිකාරය වන) සමිති ආඥාපනතෙහි 3 වැනි සහ 4 වැනි වගන්තිවලින් මා වෙත පැවරුණ බලතල ප්‍රකාර, වාණිජ සහ වෙළඳ ඇමති, වර්ණකුලසූරිය ඉව්වාම්පුල්ලිගේ හියු ප්‍රනාන්දු වන මම මේ නිවේදනයෙන්—

"සීමාසහිත සිලසුදීපනී බෞද්ධ කාන්තා සමිතිය" යන නමින් යුත් සමිතිය ආරම්භ කරනු ලැබූ පරමාර්ථය ඒ ආඥාපනතෙහි බලතල හා පහසුකම් ව්‍යාප්ත කළ යුතු පරමාර්ථයක් වශයෙන් නියම කරමි.

හියු ප්‍රනාන්දු,
වාණිජ සහ වෙළඳ ඇමති.

1970 අප්‍රේල්,
කොළඹ දී ය.

4-933

---

## 1968 අංක 30 දරන නින්දගම් ඉඩම් පනත

### 1969 (අංක 1 දරන) නින්දගම් ඉඩම් නියෝග

1968 අංක 30 දරන නින්දගම් ඉඩම් පනතේ 6, 7, 20 සහ 26 වැනි වගන්ති යටතේ ඉඩම්, වාරිමාර්ග සහ විදුලි බලය පිළිබඳ ඇමතිවරයා විසින් පනවන ලදුව, 1969 නොවැම්බර් 2 වැනි දින අංක 14,878/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1969 (අංක 1 දරන) නින්දගම් ඉඩම් නියෝග 1970 පෙබරවාරි මස 8 වැනි දින සිට අවලංගු කරනු ලැබූ ලෙස සැලකිය යුතු බව මහජනයාගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 අප්‍රේල් මස 19 වැනි දින,
කොළඹ දී ය.

4-870

## පඩිපාලක සභා ආඥාපනත

### නිවේදනයයි

1970 පෙබරවාරි මස 15 වැනි දින සිට අවුරුදු තුනක කාලයක් තුළ ශුද්ධි කොහු හා ඇට කෙඳි කොහු පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයින් වශයෙන් සේවය කිරීමට (136 වැනි අධිකාරය වන) පඩි පාලක සභා ආඥාපනතේ 9 වන වගන්තිය යටතේ කම්කරු හා රැකීරක්ෂා ගරු ඇමතිතුමන් විසින් පහත නම් සඳහන් තැනැත්තන් පත් කරන ලද බව වර්ෂ 1943 පඩිපාලක සභා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදය කරනු ලැබේ.

ඡී. පී. තම්බයියා,
ස්ථිර ලේකම්,
කම්කරු හා රැකීරක්ෂා අමාත්‍යාංශය.

1970 අප්‍රේල් මස 17 වැනි දින,
කොළඹදීය.

**නාම නියම කොට පත් කරන සාමාජිකවරු :**

1. ජී. ඕ. පීරිස් මහතා
2. ඒ. ආර්. ඇම්. සිද්දික් මහතා
3. ජී. ඇන්. ඇස්. හමීඩ් මහතා

**සේවා නියෝජිතවරු :**

1. ජේ. ඩබ්ලිව්. බී. පෙරේරා මහතා
2. පී. විල්ප්‍රඩ් පෙරේරා මහතා
3. ඔස්කර් ඇස්. මුසාජී මහතා
4. ඇල්. ඊ. වීරසේකර මහතා
5. පී. බොනියාසේ මහතා
6. ඊ. චන්සන් මහතා
7. ජේ. යූ. ක්නොස් මහතා
8. ටී. ඇම්. දුනුවිල මහතා
9. ටී. ආර්. රස්ටම්ජී මහතා
10. ඩී. ඇස්. ජයසුන්දර මහතා
11. ඩී. ඇල්. ජයවර්ධන මහතා
12. පී. නෝර්ටන් ඊ. ද සිල්වා මහතා.

**සේවක නියෝජිතවරු :**

1. වෝල්ටර් ජෝතිපාල මහතා
2. ඇල්. ඩබ්ලිව්. පණ්ඩිත මහතා
3. ඒ. ටී. පොන්සිංඤෝ මහතා
4. කේ. එච්. ද සිල්වා මහතා
5. ඔස්වින් ප්‍රනාන්දු මහතා
6. ඩබ්ලිව්. ටී. ඔබේසේකර මහතා
7. ඒ. ඇම්. සයිමන් සිංඤෝ මහතා
8. ඇන්තනී ලොඩ්වික් මහතා
9. ඇස්. සෙල්ලයියා මහතා
10. කේ. කුලවීරසිංහම් මහතා
11. ඇස්. ජයසූරිය මහතා
12. බී. ඕ. යහම්පත් මහතා.

4-886

---

## සමගි මණ්ඩල පනත

### ආඥාව

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47(2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1969 ජනවාරි 13 වන දින අංක 14,836/3 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමඟ කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ **3(1), 3(8)** හා **4(1)** වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම් මොහමඩ් හනීෆා මොහම්මදු නයිනා මරික්කාර් වන මම—

(අ) 1968 නොවැම්බර් 29 දින අංක 14,830 දරණ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3(2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උප ලේඛනයෙහි අංක 1 දරණ ස්ථානයෙහි විස්තර කරනු ලැබූ පට්ටිපොල ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායක යින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි.

1. හොප්ටන්, යපම්ම, ශ්‍රී විජයරාමවාසී පල්ලේතීරුවේ ධම්මානන්ද ස්ථවිරයන් වහන්සේ.
2. ලුනුගල රජමහ විහාරවාසී, පූජ්‍ය ඇම්. ගුණානන්ද ස්ථවිරයන් වහන්සේ.
3. ලුනුගල, වැලිවෙල, බෝධිරුක්ඛාරාමයවාසී ධම්මකිත්ති ... වීරසේකර ජයසුන්දර මුදියන්සේලාගේ පඤ්ඤා... නන්ද ස්ථවිරයන් වහන්සේ.
4. හොප්ටන්, බ/යපම්ම විදුහලෙහි, වනසිංහ මුදියන්සෙ... ගේ උඩගෙදර හුදුඅප්පු ධනපාල මහතා.
5. හොප්ටන්, යපම්ම පදිංචි සිරිසේන එදිරිසූරිය මහ...
6. හොප්ටන්, රේන්දපොල පදිංචි අන්දාහෙන්නැදි... මාර්ෂල් මහතා.
7. පල්ලේතීරුව, හුදුහේල්ලිගහවත්ත පදිංචි දිසානායක... මුදියන්සේලාගේ විජේපාල මහතා.
8. පල්ලේතීරුව, කොලනිය, කැබිල්ලගොඩ පදිංචි හේර... මුදියන්සේලාගේ ලොකුබණ්ඩා මහතා.
9. පල්ලේතීරුව, වේරගොඩ, "ගුණසිරි" හි පදිංචි රත්න... යක මුදියන්සේලාගේ ගුණසේකර මහතා.
10. ලුණුගල, මාපැල්ල, හෙලගෙදර පදිංචි මාපාබණ්ඩාරලාගේ සුදුබණ්ඩා මහතා.
11. ලුණුගල, කොට්ටල්බැද්ද, ආරාවේගෙදර පදිංචි ... මේන්ද්‍ර පටබැඳිගේ නන්දෝරිස් මහතා.
12. ලුණුගල, මාපැල්ල පදිංචි අත්තනායක මුදියන්සේලා... සුදුබණ්ඩා මහතා.
13. ලුණුගල, මාපැල්ල, පහලගෙදර, පදිංචි අත්තනා... මුදියන්සේලාගේ පුංචි බණ්ඩා මහතා.
14. ලුණුගල, අරවාකුඹුර පදිංචි පැලපොල්වත්ත ලේකම්... ගේ අප්පුහාමි මහතා.
15. ලුණුගල, අරවාකුඹුර පදිංචි දිසානායක මුදියන්සේලා... අප්පුහාමි මහතා.
16. ලුණුගල, කොට්ටල්බැද්ද, පදිංචි වුවාන් සාපින් බා... මහතා.
17. ලුණුගල, කොට්ටල්බැද්ද පදිංචි වේලුපලනියන්... කන්දයියා මහතා.
18. ලුණුගල, උඩපංගුව, පාක්වත්ත පදිංචි හැඳලලියනා... ජෝන් නසියන් පෙරේරා මහතා.
19. ලුණුගල, අරවාකුඹුර, උඩපංගුව පිහිල්ලේගෙදර, පදිං... හේරත් මුදියන්සේලාගේ පුංචි බණ්ඩා මහතා.
20. ලුණුගල, උඩපංගුව, "සමන්" හි පදිංචි හේවාබැද්දා... පීටර් ජයසිංහ මහතා.
21. හොප්ටන්, යපම්ම පදිංචි කර්නේලිස් අමරසිංහ මහ...
22. හොප්ටන්, පිස්සගම පදිංචි තල්පෙ ආරච්චිගේ අ... සිංඤෝ මහතා.

(ආ) හොප්ටන්, බ/යපම්ම විදුහලෙහි වනසිංහ මුදියන්සේලා... උඩගෙදර හුදුඅප්පු ධනපාල මහතා ඉහත කී සභාවේ... සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් ඒ... තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු තුන... විය යුතු බවද මෙයින් නියම කරමි.

එම්. එච්. එම්. නයිනා මරික්කාර්,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේ...

1970, අප්‍රේල් මස 19 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදීය.

4-985

---

## සමගි මණ්ඩල පනත

### ආඥාව

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍ර... රාජසභා ආඥාවේ 47(2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 19... ජනවාරි 13 වන දින අංක 14,836/3 දරණ අති විශේෂ ගැසට් පත්‍ර... පළ කරනු ලැබූ නිවේදනය සමඟ කියවිය යුතු 1963 අංක 12 දර... පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ... **3(1), 3(8)** හා **4(1)** වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බල... ප්‍රකාර, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම් මොහ... හනීෆා මොහම්මදු නයිනා මරික්කාර් වන මම—

(අ) 1969 ජූනි 6 වැනි දින අංක 14,857 දරණ ගැසට් පත්‍රයෙ... ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරන සමගි මණ්... පනතෙහි 3(2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ ... ලේඛනයෙහි අංක 27 දරණ ස්ථානයෙහි විස්තර කරනු ... ගහ පලාත උඩුනුවර දකුණ ගම් ප්‍රදේශය සඳහා පිහිටු...

ලැබූ සමහිදෘයකයින් ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි.

1. ගෙලිඔය, පෙතියාගොඩ පදිංචි කළුබණ්ඩා අඹහැර මහතා.
2. වැලිගල්ල, පොල්ගහංග පදිංචි විකිරිබණ්ඩා රණතුංග මහතා.
3. වැලිගල්ල, පොල්ගහංග පදිංචි විජේතුංග මුදියන්සේලාගේ රත්නායක මහතා.
4. වැලිගල්ල, උඩ අළුදෙණිය පදිංචි සමරසිංහ අධිකාරි මුදියන්සේලා ගේ කළුබණ්ඩා මහතා.
5. වැලිගල්ල පදිංචි හේරත් මුදියන්සේලාගේ පල්ලේ ගෙදර පුංචිබණ්ඩා මහතා.
6. ගෙලිඔය, දෙහිපාගොඩ පදිංචි ඒ. ඒ. වික්‍රමසිංහ මහතා.
7. ගෙලිඔය, දෙහිපාගොඩ පදිංචි ඒ. එල්. එම්. fපාරුක් මහතා.
8. ගෙලිඔය, පල්ලේඅළුදෙණිය පදිංචි දිනාවත්තේ රාල ලාගේ උක්කුබණ්ඩා මහතා.
9. වැලිගල්ල, පල්කුඹුර පදිංචි පල්කුඹුරේ විහාරේ ගෙදර උක්කු බණ්ඩා මහතා.
10. ගෙලිඔය, පල්ලේඅළුදෙණිය පදිංචි කරුණාරත්න මුදියන්සේලාගේ ගුණරත්න බණ්ඩා කරුණාරත්න මහතා.
11. මුරුතගහමුල, පිටුණුගම පදිංචි රත්නායක මුදියන්සේලාගේ දයාරත්න රත්නායක මහතා.
12. ගෙලිඔය, කොටකේදෙණිය පදිංචි විජේතුංග මුදියන් ලාගේ ජයසේකර මහතා.
13. හන්දෙස්ස, මීවලදෙණිය පදිංචි තිලකරත්න මුදියන් සේලාගේ හීන්බංඩා තිලකරත්න මහතා.
14. ගෙලිඔය, කරමඩ, "සඳසිරිය" හි පදිංචි දනසේකර මුදියන්සේලාගේ විකිරිබණ්ඩා දනසේකර මහතා.
15. ගෙලිඔය, පෙතියාගොඩ පදිංචි හේරත් මුදියන්සේලාගේ චන්ද්‍රතිලක බණ්ඩා හේරත් මහතා.
16. මුරුතගහමුල, කොහොලානේ වත්ත පදිංචි අබ්දුල් රහුමාන් ලෙබ්බේ හමීඩ් ලෙබ්බේ මහතා.
17. ගෙලිඔය, දෙහිපාගොඩ පදිංචි ඉසාක් ලෙබ්බේ හමීඩ් ලෙබ්බේ මහතා.
18. ගෙලිඔය, දෙහිපාගොඩ පදිංචි ඒ. එල්. එම්. හනීfපා මහතා.
19. ගෙලිඔය,. නවඇල්පිටිය පදිංචි අහමදු ලෙබ්බේ නුහු ලෙබ්බේ මහතා.
20. ගෙලිඔය, කළුගමුව පදිංචි ඔඩවල පතිරණ දොන් පියදාස මහතා.
21. ගෙලිඔය, පදිංචි කෝජා මුදලියාර්ගේ යුසුප් ලෙබ්බේ කාලිද් මහතා.
22. ගෙලිඔය, දෙහිපාගොඩ පදිංචි කේ. එල්. සම්සුදීන් මහතා.
23. ගෙලිඔය, දෙහිපාගොඩ පදිංචි එස්. එම්. අප්පුහාමි මහතා.
24. ගෙලිඔය, පල්ලේ අළුදෙණිය පදිංචි රත්නායක මුදියන් සේලාගේ රත්බණ්ඩා කරුණාරත්න මහතා.
25. ගෙලිඔය, කඹුරාදෙණිය පදිංචි වියදණ්ඩාකොටුවේ ගෙදර ආනා ඔමර් ලෙබ්බේ මහතා.

(ආ) ගෙලිඔය, පෙතියාගොඩ පදිංචි කළුබණ්ඩා අඹහැර මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ අඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු තුනක් විය යුතු බව ද මෙයින් නිශ්චය කරමි.

එම්. එච්. එම්. නයිනා මරික්කාර්,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1970 අප්‍රේල් මස 19 වැනි දින,
කොළඹ අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

4-984

## නොතාරිස් ආඥා පණත (107 වන අධිකාරය)

මීගමුව අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් චාල්ස් ලෙස්ලි සේනසිංහ මහතා විසින් නොතාරිස්වරුන් පිළිබඳ (පරිච්ඡේද අංක 107 දරණ) ආඥා පණතේ 22(1) දරණ වගන්තිය යටතේ 1970 ක්වූ මාර්තු මස 31 වැනි දින සිට නොතාරිස් ධුරයෙන් ඉල්ලා අස්වීමේ ලියකියවිලි ඉදිරිපත් කරන ලදුව, ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා විසින් එකී දින සිට, එම ඉල්ලා අස්වීම භාරගෙන තිබේ.

ඇ. ඒ. ගෝගලි මොරගොඩ,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 ක්වූ අප්‍රියෙල් මස 8 වැනි දින,
කොළඹ දී ය.

4-865

---

අංකය : ඩබ්. 105/276.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

### 4(1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව ලංකා කම්කරු සංගමය, අංක 72, ආනන්ද කුමාරස්වාමි මාවත, කොළඹ 7. හා කොළඹ 7, රැජින පාරේ අංක 45 දරණ සීමාසහිත ජෝර්ජ් ස්ටුවර්ට් සහ සමාගම බාරේ, ගලහ අම්බලවාන වතුයායේ අයිතිකරු වන් වන සීමාසහිත අම්බලවාන තේවතු සමාගම අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද;

කම්කරු හා රැකීරක්ෂා කටයුතු පිළිබඳ ඇමති තැන්පත් මොහොමඩ් හනීපා මොහොමඩ් වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරවුල් විශේෂ ප්‍රතිපාදන පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා අංක viii දරන කම්කරු විනිශ්චය සභාව වෙත මෙයින් යොමු කරමි.

එම්. එච්. මොහොමඩ්,
කම්කරු හා රැකීරක්ෂා කටයුතු පිළිබඳ ඇමති.

1970 මාර්තු මස 24 වැනි දින,
කොළඹ දී ය.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරය, කාර්මික ආරාවුල් පනත

ලංකා කම්කරු සංගමය,
72, ආනන්ද කුමාරස්වාමි මාවත,
කොළඹ 7.

සහ

ගලහ අම්බලවාන වතුයායේ අයිතිකරුවන් වන සීමාසහිත අම්බලවාන තේ වතු සමාගම සීමාසහිත ජෝර්ජ් ස්ටුවර්ට් සහ සමාගම බාරේ, 45, රැජින වීදිය, කොළඹ 1.

අතර පවතින කාර්මික ආරාවුලක් පිළිබඳවයි.

### ආරාවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

ලංකා කම්කරු සංගමය සහ අම්බලවාන තේ වතු සමාගම අතර ආරාවුලට හේතුවී ඇති කරුණු නම් :—

(i) 1970 අප්‍රේල් 1 වන දින සිට බලපාන සේ ගලහ අම්බලවාන වතුයායේ සේවයේ යෙදී සිටින ලංකා කම්කරු සංගමයේ සාමාජිකයන් පිළිබඳව යෝජිත සේවයෙන් පහකිරීම යුක්ති සහගතද, ඔවුන්ට කුමන සහනයක් හිමිද;

(ii) සීමාසහිත අම්බලවාන තේ වතු සමාගම විසින් ගලහ, අම්බලවාන වතුයාය විකිණීමට කර ඇති යෝජනාව සම්බන්ධයෙන් අම්බලවාන වතුයායේ සේවයේ යෙදී සිටින ලංකා කම්කරු සංගමයේ සාමාජිකයන්ගේ එකී අම්බලවාන වතුයායෙහි අනාගත රැකියාවක් පිළිබඳව විකිණීමේ ගිවිසුමෙහි ඇතුළත් කර ඇති කොන්දේසි හා

නියමයන් හි ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසා ඇත්තේ ද, නොඑසේ නම් එම නීතිරීතිවලට සහ ඊට පසුව ඇති කර ගන්නා වූ විසඳුම් ඔප්පුවෙහි එම සේවකයන්ගේ රැකියා වන් පිළිබඳව කොන්දේසි හා නියමයන් පිළිබඳව කුමන ප්‍රතිපාදනයක් ඇති කළයුතුද යන්නත් වේ.

1970 මාර්තු මස 24 වැනි ද වූ මෙදින, කොළඹ කම්කරු කොමසාරිස්වරයාගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ආර්. එල්. ගුණසේකර,
කම්කරු කොමසාරිස්.

4-867

---

අංක : ඩබ්. 105/817.

## (1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත

### 4 (1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක. 37 දරන කාර්මික ආරාවුල් පනත (විශේෂ විධිවිධාන) සමග කියැවෙන) දරන (සංශෝධිත) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 1970 ජනවාරි මස 23 දින අංක 14,890 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 1970 ජනවාරි 5 වන දින දරන නියෝගයෙන් ලංකා වතුසේවා සංගමය, 13, කන්දෙ වීදිය, මහනුවර සහ ගල්කිසසේ, ටෙම්පලර්ස් පාරෙන් ඔබ්බේ ගෝතමී පටුමගෙහි අංක 15 වේ. පී. එච්. රොබර්ට්ස් මහත්මිය බාරේ, ඇල්කඩුවේ මහ තැන්න වත්තේ අයිතිකාරිය වන ඉයුජීන් හර්මන් මහත්මිය අතර ඇති 1969 දෙසැම්බර් මස 31 දින දරණ ආරාවුල පිළිබඳව කම්කරු කොමසාරිස් වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳ වූ කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථය කිරීම සඳහා දෙහිවල, ඇලන් ඇවනිව්හි, අංක 72 හි අර්ල් ද අල්විස් මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළ යුතු යැයි දැන් පෙනියන හෙයින් කම්කරු හා රැකීරක්ෂා කටයුතු පිළිබඳ ඇමති වන මොහමඩ් හනීෆා මොහමඩ් වන මම, එකී නියෝගය අවලංගු කරන අතර එකී 1970 ජනවාරි මස 5 දින දරණ නියෝගය මත ක්‍රියා නො කරන ලෙසද මෙයින් නියෝග කරමි.

ඇම්. එච්. මොහමඩ්,
කම්කරු හා රැකීරක්ෂා කටයුතු පිළිබඳ ඇමති.

1970 අප්‍රේල් 18 දින,
කොළඹ දී ය.

4-866/1

---

අංකය : ඩබ්. 105/817.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය—(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

### 4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව ලංකා වතු සේවා සංගමය 13, කන්දෙ වීදිය, මහනුවර හා ගල්කිස්සේ, ටෙම්පලර්ස් පාරෙන් ඔබ්බේ, ගෝතමී පටුමගෙහි, අංක 15 වේ. පී. එච්. රොබර්ට්ස් මහත්මිය බාරේ, ඇල්කඩුවේ මහතැන්න වත්තේ අයිතිකාරිය වන ඉයුජීන් හර්මන් මහත්මියද අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද:

කම්කරු හා රැකීරක්ෂා කටයුතු පිළිබඳ ඇමති තැන්පත් මොහමඩ් හනීෆා මොහමඩ් වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරාවුල් විශේෂ ප්‍රතිපාදන පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා අංක. III දරන කම්කරු විනිශ්චය සභාව වෙත මෙයින් යොමු කරමි.

ඇම්. එච්. මොහමඩ්,
කම්කරු හා රැකීරක්ෂා කටයුතු පිළිබඳ ඇමති.

1970 අප්‍රේල් 18 දින,
කොළඹ දී ය.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරය, කාර්මික ආරාවුල් පනත

ලංකා වතුසේවා සංගමය,
13, කන්දේ වීදිය,
මහනුවර.

සහ

ගල්කිස්සේ ටෙම්ප්ලර්ස් පාරෙන් ඔබ්බේ, ගෝතමී පටුමගේ අංක 15 වේ, පී. එච්. රොබර්ට්ස් මහත්මිය, බාරේ, ඇල්කඩුවේ මහ තැන්න වත්තේ අයිතිකාරිය වන ඉයුජීන් හර්මන් මහත්මිය අතර පවතින කාර්මික ආරාවුලක් පිළිබඳවයි.

### ආරාවුලට හේතුව පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

පාර්ශ්වයන් අතර ආරාවුලට හේතුවී ඇති කරුණ න ඉහත සඳහන් කරනලද ලංකා වතු සේවා සංගමයේ සාමාජිකයන් වන ඇල්. ජේ. සිල්වා මහතාගේ සහකාර ලිපිකරු) සහ ඇස්. සතිවේල් මහතාගේ (සහකාර කම්හල් නිලධාරි) සේවය, මහතැන්න වත්තේ පාලක පක්ෂය විසින් අහෝසි කිරීම යුක්ති සහගතද යන්න හා ඔවුන් එකිනෙකාට කුමන සහනයක් හිමිවිය යුතුද යන්නත් ද

1970 අප්‍රේල් මස 2 වැනිදා වූ මෙදින, කොළඹ කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ආර්. ඇල්. ගුණසේකර,
කම්කරු කොමසාරිස්

4-866/2

---

අංකය : ඊ. 23/කො. 23/70.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

### 4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමිත දක්වා ඇති කාරණය පිළිබඳව එරික් එස්. ජයසිංහ මහතා, අංක 32, ඇවරිවත්ත පාර, වත්තල, එක් පාර්ශ්වයක් වශයෙන් හා අනෙක් පාර්ශ්වය වශයෙන් බ්‍රිටිෂ් සිලෝන් කෝපරේෂන් ලිමිටඩ්, හල්ස්ඩෝෆ් මිල්ස් කොළඹ 12, සහ බ්‍රිටිෂ් සිලෝන් මිලි කොම්පැණි ලිමිටඩ්, හල්ස්ඩෝෆ් මිල්ස්, කොළඹ 1 අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා රැකීරක්ෂා කටයුතු පිළිබඳ ඇමති තැන්පත් මොහමඩ් හනීෆා මොහමඩ් වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 19 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරාවුල් විශෙෂ ප්‍රතිපාදන පනත සමග කියවා) දරණ පනත්වලින් සංශෝධිත වූ, ලංකවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (19 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) ව වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් කොළඹ 5, හැව්ලොක් වටුම, බෝගල කෝට්ස්, තට්ටු නිවාස අංක 16හි, ආර්. ආර්. නල්ලයියා මහතා මෙයින් පත් කරනු ලැබේ.

ඇම්. එච්. මොහමඩ්,
කම්කරු හා රැකීරක්ෂා කටයුතු පිළිබඳ ඇමති

1970 අප්‍රේල් මස 22 වැනි දින,
කොළඹ දීය.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරය, කාර්මික ආරාවුල් පනත

එරික් එස්. ජයසිංහ මහතා,
අංක 32, ඇවරිවත්ත පාර, වත්තල.
එක් පාර්ශ්වයක් වශයෙන් ද,

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන් බ්‍රිටිෂ් සිලෝන් කෝපරේෂන් ලිමිටඩ්, හල්ස්ඩෝෆ් මිල්ස්, කොළඹ 12 සහ බ්‍රිටිෂ් සිලෝන් මිලිං කොම්පැණි ලිමිටඩ්, හල්ස්ඩෝෆ් මිල්ස් කොළඹ 12.

අතර පවතින කාර්මික ආරාවුලක් පිළිබඳවයි.

### ආරාවුල්වලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ආරවුලට හේතුවී ඇති කරුණ නම්—

(i) බ්‍රිටිෂ් සිලෝන් මිලිං කොම්පැණි ලිමිටඩ්හි පාලක පක්ෂය විසින් එරික් එස්. ජයසිංහ මහතා සහකාර කළමනාකරු (වෙළඳ) 1969 ඔක්තෝබර් 30 වන දින සිට සේවයෙන් පහකිරීම යුක්ති සහගතද, ඔහුට කුමන සහනයක් හිමි

(ii) බ්‍රිටිෂ් සිලෝන් කෝපරේෂන් ලිමිටඩ්හි පාලක පක්ෂය විසින් එරික් එස්. ජයසිංහ මහතා 1961 අගෝස්තු 1 වන දින සිට 1964 දෙසැම්බර් 31 වන දින දක්වා, බ්‍රිටිෂ් සිලෝන් කෝපරේෂන් ලිමිටඩ් වෙනුවෙන් කැන්වසර් කෙනෙකු වශයෙන් උපයන ලද අඩුවෙන් ගෙවා ඇති කොමිස් මුදල් වෙනුවෙන් ලැබිය යුතු රු. 26,986.19 නොගෙවීම යුක්ති සහගතද ? ඔහුට කුමන සහනයක් හිමිද ?

(iii) බ්‍රිටිෂ් සිලෝන් මිලිං කොම්පැණි ලිමිටඩ්හි පාලක පක්ෂය විසින් 1969 වර්ෂය සඳහා එරික් එස්. ජයසිංහ මහතාට ප්‍රසාද දීමනා වශයෙන් රු. 1,350ක් නොගෙවීම යුක්ති සහගතද ? ඔහුට කුමන සහනයක් හිමිද යන්නත් වේ.

1970 අප්‍රේල් මස 5 වැනි දා වූ මෙදින, කොළඹ කම්කරු කොමසාරිස්වරයාගේ කාර්යාලයේ දී දින යොදන ලදී.

ආර්. එල්. ගුණසේකර,
කම්කරු කොමසාරිස්.

4-922

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

මගේ අංකය : නීති/ණ/414.

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

**උකස් කරනු ලැබූ ඉඩම්, ජාතික නිවාස ආඥාපනතේ (ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 401 වැනි පරිච්ඡේදය) අංක 76 දරණ වගන්තිය යටතේ හා 1966 අංක 36 දරණ (සංශෝධිත) පනත යටතේ විකිණීම සඳහා බලය දීම**

ජාතික නිවාස ආඥාපනතේ අංක 9(1) බී දරණ වගන්තිය යටතේ සහ එයට අදාල සංශෝධන ප්‍රනත් යටතේ පත් කරනු ලැබූ, ජාතික නිවාස සහකාර කොමසාරිස් වන ධනපාල සිරිසේන වීරසිංහ වන මම, ලංකාණ්ඩුව සඳහාත් වෙනුවෙනුත් ක්‍රියා කරමින් කොළඹ, ආර්. නාගලිංගම් ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද 1951.12.4 දින අංක 76 දරණ උකස්කරය යටතේ මුදල් ගෙවීම පැහැර හැර ඇති බැවින්, අයි. එස්. රයිහනාතු උම්මා මිය සහ එස්. එම්. කලිදීන් මයාගෙන් 1969.12.4 දින තෙක් අයවිය යුතු රුපියල් තිස්නමදාස් හතලිස් හතරයි ශත තිස්අට (රු. 39,044.38) අයකර ගැනීම සඳහාත්, එසේම 69.12.4 දින සිට විකිණීම පැවැත්වෙන දිනය හෝ සම්පූර්ණයෙන් ගෙවන දිනය දක්වාත් තවදුරටත් වූ රුපියල් දහදාස් පන්සිය (රු. 10,500) ක මුදලක් සම්බන්ධයෙන් වන පොලී මුදල වර්ෂයකට සියයට 2½ ප්‍රමාණයට යථෝක්ත උකස්කරය ප්‍රකාර 69.12.4 දින සිට විකිණීමේ දිනය තෙක් එකතු වන සියලුම දඩ මුදල් සමග අයකර ගැනීමත්, එසේ අයකර ගැනීමේදී දැරීමට සිදුවන වියදම් සහ ගාස්තු අයකර ගැනීම සඳහාත්, මීට අමුණා ඇති උපලේඛනයේ දක්වා ඇති ඉඩම සහ එයට අදාල සියළු දේ ත්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම පිණිස ආඥා නිකුත් කර, එසේ විකිණීම සඳහා කොළඹ, බෙල්මන්ට් වීදියේ අංක 7 හි එල්. එම්. නිකාලි ප්‍රසිද්ධ වෙන්දේසිකරුට බලය දෙමි.

ධනපාල වීරසිංහ,
ජාතික නිවාස සහකාර කොමසාරිස්.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවත,
කොළඹ 2,
1970 මාර්තු මස 26 වන දින.

## උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සහ නාගරිකයේ මාලිගාවත්තේ පිහිටි උතුරින් "බී6" දරණ පාරට වෙන් කරන ලද කොටසින්ද, නැගෙනහිරින් "බී2" දරණ කොටසින්ද, දකුණින් පෙරේරා සහ තවත් අයට අයත් දේපලින් සහ බටහිරින් මාලිගාවත්ත පාරෙන්ද මායිම් වූ, කේ. ජී. ඩබ්. සිල්වා බලයලත් මිනින්දෝරු තැන විසින් සකසන ලද අංක 324 හා 1942.5.23 දින දරණ මානක සැලැස්ම අනුව පර්චස් විසි දෙකයි දශම දෙකයි හතක (අක්කර 0, රූඩ් 0, පර්චස් 22.27) ප්‍රමාණයෙන් යුත් නමුත් රූඩ් එකයි පර්චස් තුනයි දශම හතරයි දෙකක (අක්කර 0, රූඩ් 1, පර්චස් 3.42) ක් සේ වැරදි ලෙස සඳහන් මාලිගාවත්ත පාරේ වරිපනම් අංක 76 දරණ තෙලඹුගහවත්ත නොහොත් තෙලඹුගහ ඹවිට නැමැති "බී1" දරණ කොටස සහ එහි ඇති ගොඩනැගිලි.

4-1007

## ප්‍රකාශනයයි

නැගෙනහිර පළාතේ මඩකලපු දිස්ත්‍රික්කයේ දකුණු මන්මුනෙයි, එරුවිල්, පෝරතිව්පත්තු සහ බටහිර මන්මුනෙයි ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ මුනයිකාඩු, කාන්චිරංකුඩා, මුතලයිකුඩා, කොක්කට්ටිචෝලයි, කඩුක්කාමුනෙයි, තුම්පන්කේනි, පාලුගාමම්, මහිලඩිතිව්, අරසඩිතිව්, ගම්වල ගවයින් අතර, "කුර සහ මුව" නමැති රෝගය පැතිරී යන බැවින් රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන් පත් අබේරත්න බණ්ඩාරනායක වන මම 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) පනත යටතේ මට පැවරී තිබෙන බලතල අනුව සහ (සතුන්ගේ) බෝවෙන රෝග පිළිබඳ ආඥාපනතේ 4 වැනි වගන්තියේ 1 වැනි වගන්තිය (470 වැනි පරිච්ඡේදය) අනුව පහත සඳහන් සීමා ඇතුලත පිහිටි ප්‍රදේශය බෝවෙන රෝග ඇති ප්‍රදේශයක් කොට සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි.

උතුරට : මඩකලපුවේ කලපුව වවුනතීව් සිට කන්නන්කුඩා දක්වා වවුනතීව් තුඩුවේ සිට වවුනතීව් ගම දක්වා.

දකුණට : වෙල්ලාවලි හන්දිය සිට පතිරිප්පු පාලම දක්වා.
නැගෙනහිරට : කන්නන්කුඩා සිට පතිරිප්පු පාලම දක්වා කලපුව.

බටහිරට : වවුනතිවු සිට වෙල්ලාවලි හන්දිය දක්වා මහපාර.

2. මෙම ආඥා පනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුලත ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳිනාලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවෙන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශය ඒ ඒ නිලධාරීන් විසින් නිත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු ගවහිමියන් හා කරත්තකරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීති රීති සම්බන්ධව වැඩි විස්තර මඩකලපු පශු වෛද්‍ය තැනගේ හෝ මන්මුනෙයි, එරුවිල්, පොරතිව්පත්තු සහ බටහිර මුන්මුනෙයි ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩිදුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු වන බව දතයුතුයි.

අබේරත්න බණ්ඩාරනායක,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරී.

1970 අප්‍රියෙල් මස 20 වැනි දින,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (ස. පා. හා. සෞ.)
කාර්යාලයේ දී ය.
තැ. පෙ. 1284, කොළඹ 2.

4-928

---

## බදුල්ල දිස්ත්‍රික්කයේ යටිකිඳ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ ග්‍රාම සේවක කොට්ඨාශයන් ප්‍රතිසංස්ථාපනය කිරීම

ඉහත කී කරුණ ගැන 1970 පෙබරවාරි මස 20 වැනි දින අංක 14,894 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරන ලද දැන්වීමේ (අ) ඡේදයේ අංක 78 දරණ බදුල්ල දකුණ ග්‍රාම සේවක කොට්ඨාශයට පහත සඳහන් බදුල්ල මහ නගර සභා කොට්ඨාශ ද ඇතුලත් වේ.

හිඟුරුගමුව ග්‍රාම සේවක කොට්ඨාශයට අයත් නොවන, බදුල්ල මහ නගර සභාවේ අංක 14 දරණ කොටසේ 'හිඟුරුගමුව'.

හිඟුරුගමුව ග්‍රාම සේවක කොට්ඨාශයට අයත් නොවන, බදුල්ල මහ නගර සභාවේ අංක 15 දරණ කොටසේ 'හිඳගොඩ'.

ඉඹුල්ගොඩ ග්‍රාම සේවක කොට්ඨාශයට අයත් නොවන බදුල්ල මහ නගර සභාවේ අංක 13 දරණ කොටසේ 'කණුපැලැල්ල'

2. (අ) (1) කොටසේ ගුරුන්දවත්ත යන්න 'වෙලේකඩේ' යනුවෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ඒ. මාදෙන,
බදුල්ල දිස්ත්‍රික්කයේ වැඩ බලන දිසාපති.

1970 අප්‍රියෙල් මස 17 වැනි දින,
බදුල්ල දිසාපති කාර්යාලයේ දිය.

4-935

## කෑගල්ල දිස්ත්‍රික්කයේ කිණිගොඩ කෝරළයේ ආදායම් නිලධාරි කොට්ඨාශයේ ග්‍රාම සේවක කොට්ඨාශ ප්‍රතිසංස්ථාපනය කිරීම

1970 මැයි මස 1 වෙනි දින සිට කෑගල්ල පාලන දිස්ත්‍රික්කයේ කිණිගොඩ කෝරළයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ අංක 3සී—හේවාදිවෙල ග්‍රාම සේවක කොට්ඨාශය, අංක 3සී—හේවාදිවෙල (උතුර) සහ අංක 3ඩී—හේවාදිවෙල (දකුණ) යනුවෙන් ග්‍රාම සේවක කොට්ඨාශ දෙකකට බෙදා ඇති බව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

(අ) පහත සඳහන් ගම් අංක 3සී—හේවාදිවෙල (උතුර) ග්‍රාම සේවක කොට්ඨාශයට ඇතුලත් වේ :—

1. පාලුවත්ත
2. රොටුපිහිල්ල
3. අලුගොල්ල
4. මාලිගාතැන්න.

(ආ) පහත සඳහන් ගම් අංක 3ඩී—හේවාදිවෙල (දකුණ) ග්‍රාම සේවක කොට්ඨාශයට ඇතුලත් වේ :—

1. මහගම
2. හල්වත්ත
3. වැලිකන්ද
4. කැබැල්අඹුර
5. පිටවෙල.

මෙම ග්‍රාම සේවක කොට්ඨාශ අයත් වන මහෙස්ත්‍රාත් උසාවිය, ගම්බද උසාවිය, පොලිස් වසම, උප්පැන්න සහ මරණ සහ විවාහ ලියා පදිංචි කිරීමේ කොට්ඨාශය, පලාත් පාලන ආයතනයන් සහ මැතිවරණ දිස්ත්‍රික්කය සැම දෙනාගේම දැනගැනීම සඳහා මෙහි පහත් දක්වමි :—

(1) මහේස්ත්‍රාත් උසාවිය : කෑගල්ල
(2) අයත්වන ගම්බද උසාවිය : පින්නවල
(3) පොලිස් වසම : රඹුක්කන
(4) උප්පැන්න සහ මරණ ලියා පදිංචි කිරීමේ කොට්ඨාශය : වල්ගම් පත්තුව
(5) විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය : ගල්බඩ කෝරළය
(6) පලාත් පාලන ආයතනය : පදවිගම්පොල ගම්කාර්ය සභාව
(7) මැතිවරණ දිස්ත්‍රික්කය : රඹුක්කන.

එස්. මාරලන්ද,
කෑගල්ල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1970 මාර්තු මස 13 වැනි දින,
කෑගල්ලේ දිසාපති කාර්යාලයේදීය.

4-875/1

---

## කෑගල්ල දිස්ත්‍රික්කයේ කිණිගොඩ කෝරළයේ ආදායම් නිලධාරි කොට්ඨාශයේ ග්‍රාම සේවක කොට්ඨාශ ප්‍රතිසංස්ථාපනය කිරීම

1970 මැයි මස 1 වෙනි දින සිට කෑගල්ල පාලන දිස්ත්‍රික්කයේ කිණිගොඩ කෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ අංක 13 දරණ ගල්පොල ග්‍රාම සේවක කොට්ඨාශය, අංක 13 ගල්පොල (බටහිර) සහ අංක 13ඒ ගල්පොල (නැගෙනහිර) යනුවෙන් ග්‍රාම සේවක කොට්ඨාශ දෙකකට බෙදා ඇති බව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

(අ) පහත සඳහන් ගම් අංක 13 දරණ ගල්පොල (බටහිර) ග්‍රාම සේවක කොට්ඨාශයට ඇතුලත් වේ :—

1. ගල්පොල
2. කඩුඩාඋල්ල
3. වරකාදෙනිය
4. මොලගොඩ
5. කුඹල්ඔලුව.
6. වේකොලදෙනිය
7. පොරස්ව් හිල් වත්ත
8. හිඟුල්ගොල්ල වත්ත
9. මොලගොඩවත්ත

(ආ) පහත සඳහන් ගම් අංක 13ඒ දරණ ගල්පොල (නැගෙනහිර) ග්‍රාම සේවක කොට්ඨාශයට ඇතුලත්වේ :—

1. කුඹල්දිවෙල
2. පරදණ්ඩ
3. දෙඹටපිටිය
4. වරාගොඩ
5. හැරම්විපාන
6. සිංගාගොඩ
7. පල්අරබේගම
8. පල්පාත
9. පල්පාතවත්ත අංක 1
10. පල්පාතවත්ත අංක 2.

2. මෙම ග්‍රාම සේවක කොට්ඨාශ අයත්වන මහෙස්ත්‍රාත් උසාවිය, ගම්බද උසාවිය, පොලිස් වසම, උප්පැන්න හා මරණ සහ විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය, පලාත් පාලන ආයතනයන් සහ මැතිවරණ දිස්ත්‍රික්කය සැම දෙනාගේම දැනගැනීම සඳහා මෙහි පහත දක්වමි :—

(1) අයත්වන මහෙස්ත්‍රාත් උසාවිය : කෑගල්ල
(2) අයත්වන ගම්බද උසාවිය : පින්නවල
(3) පොලිස් වසම : කෑගල්ල
(4) උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය : දෙයාල දහමුණු පත්තුව
(5) විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය : ගල්බඩ කෝරළය
(6) පලාත් පාලන ආයතන : පින්නවල ගම්කාර්ය සභාව
(7) මැතිවරණ දිස්ත්‍රික්කය : රඹුක්කන—133.

එස්. මාරලන්ද,
කෑගල්ල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1970 ක් වූ මාර්තු මස 13 වැනි දින,
කෑගල්ල දිසාපති කාර්යාලයේ දී ය.

4-875/2

---

## 1968 අංක 48 දරන වාරිමාර්ග (සංශෝධන) පනතින් සංශෝධිත (453 වන අධිකාරය වන) වාරිමාර්ග ආඥාපනත

1968 අංක 48 දරන වාරිමාර්ග (සංශෝධන) පනතේ 17 වන වගන්තිය මගින් සංශෝධිත ඉහත සඳහන් ආඥා පනතේ 33 වන වගන්තිය යටතේ කොළඹ ආණ්ඩුවේ දිසාපති විසින් සකස් කරන ලද පහත දක්වා ඇති යෝජනා ක්‍රමය ම විසින් අනුමත කරනු ලැබූ බව, ගොවිජන සේවා කොමසාරිස් සෙනවිරත්න බණ්ඩා සේනානායක වන මම, 1968 අංක 48 දරන වාරිමාර්ග (සංශෝධන) පනතේ 19 වන වගන්තිය මගින් සංශෝධිත (ලංකා ව්‍යවස්ථා ප්‍රඥප්ති සංග්‍රහයේ 453 වන අධිකාරය වන) වාරිමාර්ග ආඥාපනතේ 35 වන වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරමි.

ඇස්. බී. සේනානායක,
ගොවිජන සේවා කොමසාරිස්.

1970.1.12

### සුළු වාරිමාර්ග වැඩ වැඩිදියුණු කිරීම සඳහා යෝජනා ක්‍රමය

1. වැඩයේ නාම සහ විස්තරය :—

2. යෝජනා ක්‍රමය යටතේ ජල සම්පාදනය කළහැකි ඉඩම් ප්‍රමාණය සහ ඒවයේ ස්වභාවය :—

පෞද්ගලික ඉඩම් : දල වශයෙන් අක්කර 143 යි.

රජයේ ඉඩම් : දල වශයෙන් අක්කර නැත.

3. එකගවූ කොන්දේසි නම් :—

(1) අවශ්‍ය වැඩයේ පහත සඳහන් වැඩ කොටස්, එනම් :—

(අ) ආරක්ෂක හා ආධාර බැමි සහිත අමුණ,

(ආ) සොරොව් සහ ඇල මාර්ග.

ඇස්තමේන්තු කළ වියදම රු. 78,000 දක්වා නැතිම රජය විසින් භාර ගන්නා ලදී.

(2) රජය විසින් ඉහත සඳහන් පරිදි යථොක්ත වැඩය භාරගෙන තිබීම සලකා එම වැඩය අවසන් කළාසින් පසුව එය නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය වන සියළුම කම්කරු ශ්‍රමය සියළුම ගාස්තු රහිතව, මෙම කුඹුරුවල කට්ටි ලැබුම්කරුවන් හා අඳ ගොවියන් සහ යම් කුඹුරක කට්ටි ලැබුම් කරුවන් හෝ අඳ ගොවියන් නොමැත්තෙහි නම් එහි අයිතිකරුවන් විසින් සැපයිය යුතුයි.

(3) මෙම යෝජනා ක්‍රමය යටතේ නියමිත නම කොටස ඉටු කිරීම් යම් කුඹුරක කට්ටි ලැබුම් කරුවන්ගෙන් සහ අඳ ගොවීන්ගෙන් යම් කෙනෙක් හෝ යම් කුඹුරක කට්ටි ලැබුම්කරුවන් හෝ අඳ ගොවියන් නොමැත්තෙහි නම් මෙම ඉඩම්වල අයිතිකරුවන්ගෙන් හෝ ඕනෑම පුද්ගලයෙක් යම්සේ පැහැර හැරියහොත්, ආණ්ඩුවේ දිසාපතිවරයා විසින් යම් වෙනත් පුද්ගලයෙකු ලවා එකී කම්කරු ශ්‍රමය ඉටුකරවා ආඥාපනතේ VII වන කොටසේ නියමිත ආකාරයට වියදම් අය කරනු ලැබේ.

4-881

### නිවේදනයයි

## (40 වන අධිකාරය වන) මහජන ආරක්ෂක ආඥාපනත යටතේ අංක 14,823 හා 1968.10.18 දින දරන ආණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද හදිසි නියෝග මගින් සංශෝධිත (453 වන අධිකාරය වන) වාරිමාර්ග ආඥාපනත

යට සඳහන් ආඥාපනතේ 33 වන වගන්තිය යටතේ කොළඹ ආණ්ඩුවේ දිසාපති විසින් සකස් කරනු ලැබ පහත දක්වා ඇති යෝජනා ක්‍රමය මවිසින් අනුමත කරනු ලැබූ බව ගොවිජන සේවා කොමසාරිස් සෙනවිරත්න බණ්ඩා සේනානායක වන මම, (ලංකා ව්‍යවස්ථා ප්‍රඥප්ති සංග්‍රහයේ 40 වන අධිකාරය වන) මහජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ අග්‍රාණ්ඩුකාර වරයා විසින් පනවනු ලැබූ හදිසි (වාරිමාර්ග ආඥාපනත වෙනස් කිරීම්) නියෝග මගින් සංශෝධිත (ලංකා ව්‍යවස්ථා ප්‍රඥප්ති සංග්‍රහයේ 453 වන අධිකාරය වන) වාරිමාර්ග ආඥාපනතේ 35 වන වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරමි.

ඇස්. බී. සේනානායක,
ගොවිජන සේවා කොමසාරිස්.

16.11.1968.

**සුළු වාරිමාර්ග වැඩ වැඩි දියුණු කිරීම සඳහා යෝජනා ක්‍රමය**

1. වැඩයේ නම සහ විස්තරය : මිරිතිගල අමුණ—ඇල්/8 (2.90× 4.65).

2. යෝජනා ක්‍රමය යටතේ ජල සම්පාදනය කළහැකි ඉඩම් ප්‍රමාණය සහ ඒවායේ ස්වභාවය :—

පෞද්ගලික ඉඩම් : දල වශයෙන් අක්කර 35 යි.
රජයේ ඉඩම් : දල වශයෙන් අක්කර — යි.

3. එකඟ වූ කොන්දේසි නම් :

(1) අවශ්‍ය වැඩයේ පහත සඳහන් වැඩ කොටස්, එනම් :—

(අ) අමුණ සහ ආධාර කණ්ඩිය තැනීම.
(ආ) ජලය පිට කිරීමේ පාලන දොරටුවක් තැනීම.

ඇස්තමේන්තු කළ වියදම රු. 9,500 දක්වා තැනීම රජය විසින් භාර ගන්නා ලදී.

(2) රජය විසින් ඉහත සඳහන් පරිදි යථෝක්ත වැඩය භාර ගෙන තිබීම සලකා එම වැඩය අවසන් කළායින් පසුව එය නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය වන සියලුම කම්කරු ශ්‍රමය සියලුම ගාස්තු රහිතව, මෙම කුඹුරුවල කට්ටි ලැබුම්කරුවන් හා අඳ ගොවියන් සහ යම් කුඹුරක කට්ටි ලැබුම්කරුවන් හෝ අඳ ගොවියන් නොමැත්තෙහි නම් එහි අයිතිකරුවන් විසින් සැපයිය යුතුයි.

(3) මෙම යෝජනා ක්‍රමය යටතේ පරිවර්තිත ගාස්තු රහිතව ශ්‍රමය සැපයීම යම් හෙයකින් යම් කුඹුරක කට්ටි ලැබුම්කරුවන් ගෙන් සහ අඳ ගොවීන්ගෙන් හෝ මෙම ඉඩම්වල අයිති කරුවන්ගෙන් ඕනෑම පුද්ගලයෙක් යම්සේ පැහැර හැරියහොත් ආණ්ඩුවේ දිසාපතිවරයා විසින් යම් ඕනෑම පුද්ගලයෙකු ලවා එකී කම්කරු ශ්‍රමය ඉටු කරවා ආඥා පනතේ VII වන කොටසේ නියමිත ආකාරයට වියදම් අය කරනු ලැබේ.

4-880

---

## ලංකා ජාතික මුදල් ඉතිරිකිරීමේ ව්‍යාපාරයේ රජත ජයන්තිය සැමරීම සඳහා විශේෂ මුද්දර නිකුත් කිරීම

ලංකා ජාතික මුදල් ඉතිරිකිරීමේ ව්‍යාපාරයේ රජත ජයන්තිය සැමරීම සඳහා 1969 මාර්තු 20 දින නිකුත් කරන ලද ශත 3 වටිනා කමින් යුක්ත වූ විශේෂ මුද්දරවල අලෙවි කිරීමේ කාලය 1970 දෙසැම්බර් 31 වන දින හෝ මුද්දර තොගය අවසන් වන දිනය යන මේ දෙදිනෙන් කලින් එළඹෙන දිනය තෙක් තවදුරටත් දීර්ඝ කළ බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

ස. සිට්ටම්පලම්,
දේශීය ආදායම් කොමසාරිස්.

1970 අප්‍රේල් 20,
කොළඹ 1,
දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දීය.

4-873

---

## ලංකා රජයේ උකස් බැංකුව

ලංකා රජයේ උකස් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 1968 ඔක්තෝබර් 7 වෙනි දින පවත්වන ලද රැස්වීමේ දී පහත සඳහන් පරිදි විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කර සම්මත කරන ලදී.

(1) ඒ. ඒෆ්. බී. ද. ඩබ්. තිලකරත්න ප්‍රසිද්ධ නොතාරිස් විසින් කරන ලද 1959 දෙසැම්බර් 22 හා අංක 526 දරන උකස් කරය මත කොළඹ 14, අව්වල් සාවියා පාරේ අංක 44 දරණ තැන පදිංචි කළුතන්ත්‍රිගේ කරුණාවතී පීරිස් ගුණතිලක මහත්මිය යන අයගෙන් 1968.9.4 දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රු. 18,605.57 ක මුදලක් හා 1968.9.5 දින සිට ගෙවනු ලබන දින තෙක් රු. 15,734.98 ක මුදල මත අවුරුද්දට සියයට $5\frac{1}{2}$ පොළියක් ද, රු. 35.69 ක මුදල මත සියයට $4\frac{1}{2}$ පොළියක් ද තවදුරටත් ලැබිය යුතුය.

(2) 1968 අංක 33 දරණ ලංකා රජයේ උකස් බැංකු සහ මුදල් (සංශෝධන) පනතින් සංශෝධිත ලංකා රජයේ උකස් බැංකු ආඥාපනතේ (398 අධිකාරය) 61 ඕ වගන්තිය ප්‍රකාර පහත සඳහන් දේපොළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළඹ 1, කොටුවේ, බේලි වීදියේ අංක 20 දරණ තැන ඒ. එම්. මාර්සූක් වෙන්දේසිකරුට අවසරය හා බලය දෙන ලදී.

ඉහත කී කළුතන්ත්‍රිගේ කරුණාවතී පීරිස් ගුණතිලක මහත්මිය යන අයගෙන් ඉහත කී උකස්කරය මත අය විය යුතු රු. 18, 605.57 ක මුදල සහ 1968.9.5 දින සිට වෙන්දේසිය පැවැත්වෙන දින දක්වා රු. 15,734.98 ක මුදල මත අවුරුද්දට සියයට $5\frac{1}{2}$ බැගින් පොළියද, රු. 35.69 ක මුදල මත අවුරුද්දකට සියයට $4\frac{1}{2}$ බැගින් පොළියද, ලංකා රජයේ උකස් බැංකු ආඥාපනතේ 63 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි වියහියදම් හා මුදල් ද අයකර ගනු සඳහා, මෙම බැංකුවට ඇප වශයෙන් උකස් කර ඇති—

බලය ලත් මිනින්දෝරු ඩී. ඒ. මැන්දිස් විසින් සාදන ලද 1959 අගෝස්තු 16 හා අංක 72 දරණ පිඹුර ප්‍රකාර ප්‍රමාණයෙන් පර්චස් දොළහයි දශම තුනයි බිංදුවක් වූ (අ. 0, රූ. 0, පර්. 12.30) බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හා නාගරික සහා සීමා තුළ නිව් බසාර් කොට්ඨාශයේ පිහිටි අව්වල් සාවියා පාරේ වරිපනම් අංක 44 දරණ ගොඩනැගිල්ල හා ඉඩම.

එච්. බී. කපුවත්තේ,
සාමාන්‍යාධිකාරි,

1970 මාර්තු 17.
කොළඹ.

4-911

---

## ලංකා රජයේ උකස් බැංකුව

ලංකා රජයේ උකස් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 1968 අගෝස්තු 23 වෙනි දින පවත්වන ලද රැස්වීමේදී පහත සඳහන් පරිදි විශේෂ යෙන් හා ඒකමතිකව තීරණය කර සම්මත කරන ලදී.

(1) ඊ. ඒෆ්. ද සිල්වා ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් සහතික කරන ලද 1958 මැයි 6 වෙනි දින හා අංක 289 දරණ උකස් කරය මත කොළඹ 8, කොටා ටෙරස් හි, අංක 7 දරණ තැන සිත්ති සනූබා මොහමඩ් මහත්මිය යන අයගෙන් 1968.7.13 දින දක්වා මුල් මුදල හා පොලිය වශයෙන් රු. 32,067.87 ක මුදලක් හා 1968.7.14 දින සිට ගෙවනු ලබන දින තෙක් රු. 26,683.10 ක මුදල මත අවුරුද්දකට සියයට $5\frac{1}{2}$ පොළියක් හා රු. 112.62 ක මුදල මත අවුරුද්දට සියයට $4\frac{1}{2}$ ක පොළියක් තව දුරටත් ලැබිය යුතුයි.

(2) 1968 අංක 33 දරණ ලංකා රජයේ උකස් බැංකු හා මුදල් (සංශෝධන) පනතින් සංශෝධිත ලංකා රජයේ උකස් බැංකු ආඥාපනතේ (398 අධිකාරය 61 ඕ වගන්තියේ ප්‍රකාර පහත සඳහන් දේපොළ ප්‍රසිද්ධියේ විකිණීමට කොළඹ 1, බේලි වීදියේ අංක 20 දරණ තැන ඒ. එම්. මාර්සූක් වෙන්දේසිකරුට අවසරය හා බලය දෙන ලදී.

ඉහතකී සිත්ති සනූබා මොහමඩ් මහත්මිය යන අය ගෙන් ඉහත සඳහන් උකස්කරය මත අයවිය යුතු රු. 32,067.87 ක මුදල සහ 1968.7.14 දින සිට වෙන්දේසිය පැවත්වෙන දින දක්වා රු. 26,683.10 ක මුදල මත අවුරුද්දට සියයට $5\frac{1}{2}$ බැගින් පොළියක් හා රු. 112.62 ක මුදල මත අවුරුද්ට සියයට $4\frac{1}{2}$ ක පොළියද, ලංකා රජයේ උකස් බැංකු ආඥා පනතේ 63 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි විය හියදම් හා මුදල් ද අය කර ගනු සඳහා, මෙම බැංකුවට ඇප වශයෙන් උකස් කර ඇති—

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හා නාගරික යෙ, ප්‍රථමයෙන් දෙමටගොඩ කොට්ඨාශයේ ද, දැනට බොරැල්ල කොට්ඨාශයේ ද කොටා පාරට ඔබ්බෙන් කොටා ටෙරස් හි අංක 7 දරණ ගොඩනැගිල්ල හා එහි බිම් කොටස (ජී. එච්. ලුඩොවික් බලය ලත් මිනින්දෝරු තැන විසින් සාදන ලද අංක 53ඒ හා 1936 සැප්තැම්බර් 7 දින දරණ

පිඹුර අනුව අංක 1 දර බිම් කට්ටිය වශයෙන් සළකුණු කර ඇති)—ප්‍රමාණයෙන්, බලය ලත් මිනින්දෝරු එම්. අයි එල්. මරිකාර් විසින් සාදන ලද අංක 2116 හා 1940 මාර්තු 21 දින දරණ පිඹුර අනුව පර්චස් දහහතයක් හා දශම එකයි බිංදුවක් වේ. (අ. 0, රූ. 0, පර්. 10.10) සහ ඉහත කී අංක 53ඒ දරණ පිඹුර අනුව අංක 6 දරණ බිම් කට්ටිය වශයෙන් සළකුණු කරන ලද පාර.

එච්. බී. කපුවත්තේ,
සාමාන්‍යාධිකාරී,

1970 මාර්තු 4 දින.

4-910

---

## ලංකා රජයේ උකස් බැංකුව

ණ. 4653

ලංකා රජයේ උකස් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය් 1968 සැප්තැම්බර 25 වෙනි දින පවත්වන ලද රැස්වීමේදී පහත සඳහන් පරිදි විශේෂයෙන් හා ඒකමත්‍යකව තීරණය කර සම්මත කර ගන්නා ලදී.

(1) ඒ. එෆ්. බී. ඩබ්ලිව්. තිලකරත්න ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද 1959 මැයි 13 දින හා අංක 499 දරණ උකස්කරය මත කොළඹ 6, වැල්ලවත්තේ, ගාලු පාරේ අංක 75 දරණ ස්ථානයේ පදිංචි සේමගේ එඩ්ගාර් ප්‍රනාන්දු යන අයගෙන් 1968.8.18 දින දක්වා මුල් මුදල හා පොලිය වශයෙන් රු. 27,311.73ක මුදලක් හා 1968.8.19 දින සිට ගෙවනු ලබන දනතෙක් රු. 24,179.21ක මුදල සඳහා අවුරුද්දට සියයට 5½ පොලියක් තවදුරටත් ලැබිය යුතුයි.

(2) 1968 අංක 33 දරණ ලංකා රජයේ උකස් බැංකු හා මුදල් (සංශෝධන) පනතින් සංශෝධිත ලංකා රජයේ උකස් බැංකු ආඥාපනතේ (398 අධිකාරය) 61 වී වගන්තියේ ප්‍රකාර පහත සඳහන් දේපොළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළඹ 1, කැනල් රෝඩ්, අංක 35 දරණ තැන, වින්ස්ටන් මෙලිස් ප්‍රනාන්දු වෙන්දේසි කරුට අවසරය හා බලය දෙන ලදී.

ඉහත කී සේමගේ එඩ්ගාර් ප්‍රනාන්දු යන අයගෙන් ඉහත සඳහන් උකස්කරය මත අය විය යුතු රු. 27,311,73ක මුදල සහ 1968.8.19 දින සිට වෙන්දේසිය පැවැත්වෙන දින දක්වා රු. 24,179.21ක මුදල මත අවුරුද්දකට සියයට 5½ බැගින් පොලියද, ලංකා රජයේ උකස් බැංකු ආඥා පනතේ 63 වගන්තිය යටතේ අය කර ගත හැකි වියහිය දම් හා මුදල් ද අය කර ගනු සඳහා, මෙම බැංකුවට ඇප වශයෙන් උකස් කර ඇති—

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හා එම නාගරිකයේ බම්බලපිටිය කොට්ඨාශයේ, කොල්ලුපිටියේ, "චාල්ස් වේ" හි වරිපනම් අංක 13/1 දරණ ගොඩනැගිල්ල සහ බලයලත් මිනින්දෝරු ඊ. අයි. ඒ. ආනන්දප්පා මහතා විසින් සාදන ලද 1952 මැයි 5 දින හා අංක 424 දරණ පිඹුර අනුව සළකුණු කරන ලද අංක 2 දරණ, ප්‍රමාණයෙන් පර්චස් විසි දෙකක් වූ (අ. 0, රූ. 0, ප. 22) බිම් කොටස, සහ අංක 424 දරණ ඉහත කී පිඹුරේ අංක 4 දරණ බිම් කොටස වශයෙන් සළකුණු කරන ලද පාර.

එච්. බී. කපුවත්තේ,
සාමාන්‍යාධිකාරී.

1970 මාර්තු 10.

4-909

---

## ලංකා රජයේ උකස් බැංකුව

ණ. 2594

ලංකා රජයේ උකස් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 1969 නොවැම්බර් 20 වෙනි දින පවත්වන ලද රැස්වීමේදී පහත සඳහන් පරිදි විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කර සම්මත කර ගන්නා ලදී.

(1) එෆ්. බී. එල්. කොක් ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද 1956 සැප්තැම්බර් 22 දින හා අංක 627 දරණ උකස්කරය මත කොළඹ 3, පෙන්ඩනිස් මාවතේ අංක 10 දරණ තැන පදිංචි චන්ද්‍රා දත්ත අබේසිරි ගුණවර්ධන සහ ධර්මපාල අබේසිරි ගුණවර්ධන යන දෙදෙනාගෙන් 1969.9.12 දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් රු. 75,197.57ක මුදලක් හා 1969.9.13 දින සිට ගෙවනු ලබන දින තෙක් රු. 65,210.41ක මුදල මත අවුරුද්දට සියයට 5½ පොලියක් තවදුරටත් ලැබිය යුතුයි.

(2) 1968 අංක 33 දරණ ලංකා රජයේ උකස් බැංකු හා මුදල් (සංශෝධන) පනතින් සංශෝධිත ලංකා රජයේ උකස් බැංකු ආඥාපනතේ (398 අධිකාරය) 61 වී වගන්තියේ ප්‍රකාර පහත සඳහන් දේපොළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට නුවර, කුවින්ස් හෝටලයේ, පිග්ෆර්ඩ්ස් ඒජන්සිහි වෙන්දේසිකාර පී. ද එස්. පණ්ඩිතරත්න වෙන්දේසිකරුට අවසරය හා බලය දෙන ලදී.

ඉහත කී චන්ද්‍රා දත්ත අබේසිරි ගුණවර්ධන සහ ධර්මපාල අබේසිරි ගුණවර්ධන යන දෙදෙනාගෙන් ඉහත සඳහන් උකස්කරය මත අය විය යුතු රු. 75,197.57ක මුදල සහ 1969.9.13 දින සිට වෙන්දේසිය පැවැත්වෙන දින දක්වා රු. 65,210.41ක මුදල මත අවුරුද්දකට සියයට 5½ බැගින් පොලියද, ලංකා රජයේ උකස් බැංකු ආඥා පනතේ 63 වෙනි වගන්තිය යටතේ අය කර ගත හැකි වියහියදම් හා මුදල් ද අය කර ගනු සඳහා, මෙම බැංකුවට ඇප වශයෙන් උකස් කර ඇති—

වී. ජේ. සී. ජොන්ක්ලස් බලයලත් මිනින්දෝරු තැන විසින් සාදන ලද 1930 අප්‍රේල් 26 දින හා අංක 1104 දරණ පිඹුර ප්‍රකාර පැක්ටෙරි, යන්ත්‍රසූත්‍ර සවි කිරීම් හා වෙනත් ගොඩනැගිලි ඇතුළුව "විපරරි එස්ටේට්" යනුවෙන් හඳුන්වන හා නමැති සියලු එකී මෙකී වතු වැවිලි සහ බිම්ද, මෙහි පහත සඳහන් බිම් කට්ටිත් ගෙන්ද යුක්ත වේ.

1. සර්වේ ජෙනරාල් එල්. ජී. ඕ. වුඩ්හවුස් විසින් සකස් කරන ලද 1939 අප්‍රේල් 12 දින හා පී 22486 දරණ මිනුම හා විස්තර ප්‍රකාර ප්‍රමාණයෙන් අක්කර එකසියහැටඅටයි, රූඩ් දෙකයි, පර්චස් දාහතරක් වූ (අ. 168, රූ. 2, පර්. 14) මැද පළාතේ, නුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තු ගලසියපත්තුවේ වැලිගල්ල සහ වැවල පිහිටි "විපරරි එස්ටේට්" නමැති සියලුම බිම් කොටස් සහිත ඉඩම්.

2. සර්වේ ජෙනරාල් එල්. ජී. ඕ. වුඩ්හවුස් විසින් සකස් කරන ලද 1939 අප්‍රේල් 12 දින හා පී 22487 දරණ මිනුම හා විස්තර ප්‍රකාර, දිය පාර හැර, ප්‍රමාණයෙන් අක්කර පහක් හා පර්චස් පහක් වූ (අ. 5, රූ. 0, පර්. 5) ඉහත කී වැලිගල්ල හා වැවල පිහිටි විපරරි එස්ටේට් නමැති සියලුම බිම් කොටස් සහිත ඉඩම්.

3. සර්වේ ජෙනරාල් එල්. ජී. ඕ. වුඩ්හවුස් විසින් සකස් කරන ලද 1939 අප්‍රේල් 12 දින හා පී 22488 දරණ මිනුම හා විස්තරය ප්‍රකාර ප්‍රමාණයෙන් රූඩ් තුනයි, පර්චස් අටක් වූ (අ. 0, රූ. 3, පර්. 8) ඉහත කී වැලිගල්ල පිහිටි විපරරි එස්ටේට් නමැති සියලුම බිම් කොටස් සහිත ඉඩම.

4. සර්වේ ජෙනරාල් එල්. ජී. ඕ. වුඩ්හවුස් විසින් සකස් කරන ලද 1939 අප්‍රේල් 12 දින හා පී. 22489 දරණ මිනුම හා විස්තර ප්‍රකාර (පාරක් සඳහා වෙන් කර ඇති බිම හැර) ප්‍රමාණයෙන් අක්කර දහයයි රූඩ් දෙකයි පර්චස් තිස්හයක් වූ (අ. 10, රූ. 2, ප. 36) ඉහත කී ගලසියපත්තුවේ වැලිගල්ල හා ඇල්දෙනිය පිහිටි විපරරි එස්ටේට් නමැති සියලුම බිම් කොටස් සහිත ඉඩම්.

5. සර්වේ ජෙනරාල් එල්. ජී. ඕ. වුඩ්හවුස් විසින් සකස් කරන ලද 1939 අප්‍රේල් 12 දින හා පී. 22490 දරණ මිනුම හා විස්තර ප්‍රකාර ප්‍රමාණයෙන් රූඩ් එකයි, පර්චස් දහඅටක් වූ (අ. 0, රූ. 1, පර්. 18) ඉහත කී ගලසියපත්තුවේ දොලපිහිල්ල පිහිටි විපරරි එස්ටේට් නමැති සියලුම බිම් කොටස් සහිත ඉඩම්.

6. සර්වේ ජෙනරාල් එල්. ජී. ඕ. වුඩ්හවුස් විසින් සකස් කරන ලද 1939 අප්‍රේල් 12 දින හා පී 22491 දරණ මිනුම් හා විස්තර ප්‍රකාර ප්‍රමාණයෙන් අක්කර දහතුනයි, රූඩ් එකයි, පර්චස් තිස් දෙකක් වූ (අ. 13, රූ. 1, පර්. 32) ඉහත කී ගලසියපත්තුවේ දොලපිහිල්ල සහ වැලිගල්ල පිහිටි විපරරි එස්ටේට් නමැති සියලුම බිම් කොටස් සහිත ඉඩම්.

7. එල්. ජී. ඕ. වුඩ්හවුස් සර්වේ ජෙනරාල් විසින් සකස් කරන ලද 1939 අප්‍රේල් 12 දින හා පී. 22,492 දරණ (පාරක් සඳහා වෙන් කර ඇති බිම හැර) ප්‍රමාණයෙන් අක්කර විස්සයි, රූඩ් එකක්වූ (අ. 20, රූ. 1, පර්. 00) ඉහත කී ගලසියපත්තුවේ වැලිගල්ල හා මැදගොඩ පිහිටි විපරරි එස්ටේට් නමැති සියලුම බිම් කොටස් සහිත ඉඩම්.

8. සර්වේ ජෙනරාල් ජී. කේ. තෝන්හිල් විසින් සකස් කරන ලද 1938 ජූලි 19 දින හා අංක 426792 දරණ මිනුම හා විස්තර ප්‍රකාර ප්‍රමාණයෙන් පර්චස් විසිඅටක්වූ (අ. 0, රූ. 0, පර්. 28) ඉහත කී වැවල පිහිටි විපරරි එස්ටේට් නමැති සියලුම බිම් කොටස් සහිත ඉඩම්.

9. සර්වේ ජෙනරාල් ජී. කේ. තෝන්හිල් විසින් සකස් කරන ලද 1933 ජූලි 19 දින හා අංක 426793 දරණ මිනුම හා විස්තර ප්‍රකාර ප්‍රමාණයෙන් රූඩ් දෙකක් වූ (අ. 0, රූ. 2, පර්. 00) ඉහත කී වැලිගල්ල පිහිටි විපරිට් එස්ටේට් නමැති සියලුම බිම් කොටස් සහිත ඉඩම්.

10. සර්වේ ජෙනරාල් ජී. කේ. තෝන්හිල් විසින් සකස් කරන ලද 1933 ජූලි 19 දින හා අංක 426794 දරණ මිනුම හා විස්තර ප්‍රකාර ප්‍රමාණයෙන් රූඩ් තුනයි පර්චස් තිස්හතක් වූ (අ. 0, රූඩ් 3, පර්. 37) ඉහත කී මැදගොඩ පිහිටි විපරිට් එස්ටේට් නමැති සියලුම බිම් කොටස් සහිත ඉඩම්.

එච්. බී. කපුවත්තේ,
සංමාතාසංඩිකාරි.

1970 මාර්තු 2.

4-908

---

## මාතර දිස්ත්‍රික්කයේ ගහබඩ පත්තුවේ ප්‍රාදේශීය ආදායම් නිළධාරි කොට්ඨාශයේ ග්‍රාමසේවක කොට්ඨාශ ප්‍රතිසංස්ථාපනය කිරීම

1970 මැයි මස 1 දින සිට මාතර පාලන දිස්ත්‍රික්කයේ ගහබඩ පත්තුවේ ප්‍රාදේශීය ආදායම් නිළධාරි කොට්ඨාශයෙහි අංක 305 දරණ වැලිහේන ග්‍රාමසේවක කොට්ඨාශයත් අංක 306 දරණ තලහගම ග්‍රාමසේවක කොට්ඨාශයත් පහත විස්තර වන පරිදි ‘‘ වැලිහේන ’’, තලහගම නැගෙනහිර, සහ තලහගම බටහිර යනුවෙන් ග්‍රාමසේවක කොට්ඨාශ තුනකට බෙදා ඇති බව මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

(අ) පහත සඳහන් ජනපද/ගම් අංක 305 දරණ වැලිහේන ග්‍රාමසේවක කොට්ඨාශයට ඇතුළත් වේ :—

(1) දෙමටපස්ස
(2) දිවිතුරේ
(3) වැලිහේන කොටසක්.

(ආ) පහත සඳහන් ගම් අංක 306 දරණ තලහගම නැගෙනහිර ග්‍රාමසේවක කොට්ඨාශයට ඇතුළත් වේ :—

(1) තලහගම කොටසක්, අළුකැටියද සමඟ
(2) වේනගම කොටසක්
(3) වැලිහේන කොටසක්.

(ඇ) පහත සඳහන් ගම අංක 306ඒ දරණ තලහගම බටහිර ග්‍රාමසේවක කොට්ඨාශයට ඇතුළත් වේ :—

(1) හව්පෙ
(2) ගැඩිප්පල
(3) තලහගම කොටසක්
(4) වේනගම කොටසක්
(5) වැලිහේන කොටසක්.

2. මෙම ග්‍රාමසේවක කොට්ඨාශ අයත් වන මහේස්ත්‍රාත් උසාවිය, ගම්සභා උසාවිය, පොලිස් වසම, උප්පැන්න, මරණ සහ විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය, පළාත් පාලන ආයතනයන් සහ මැතිවරණ දිස්ත්‍රික්කය සැම දෙනාගේම දැනගැනීම සඳහා මෙහි පහත දක්වමි.

| ග්‍රාමසේවක කොට්ඨාශය | මහේස්ත්‍රාත් උසාවිය | ගම්බද උසාවිය | පොලිස් වසම | උප්පැන්න මරණ සහ විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය | පළාත් පාලක ආයතනය | මැතිවරණ දිස්ත්‍රික්කය |
|---|---|---|---|---|---|---|
| (i) වැලිහේන ... | මාතර ... | ගොඩපිටිය ... | අකුරැස්ස ... | ගොඩපිටිය ... | ගොඩපිටිය ගම් සභාව | අංක 65—අකුරැස්ස |
| (ii) තලහගම නැගෙනහිර ... | මාතර ... | ගොඩපිටිය ... | අකුරැස්ස ... | ගොඩපිටිය ... | ගොඩපිටිය ගම්සභාව ... | අංක 65—අකුරැස්ස |
| (iii) තලහගම බටහිර ... | මාතර ... | ගොඩපිටිය ... | අකුරැස්ස ... | ගොඩපිටිය ... | ගොඩපිටිය ගම්සභාව ... | අංක 65—අකුරැස්ස |

3. අංක 14,873 සහ 1969.9.26 වැනි දින ගැසට් පත්‍රයේ පළ වී ඇති මගේ 1969 ජූලි මස 29 වැනි දිනැති නිවේදනය මෙයින් අවලංගු කරමි.

එම්. එල්. ජේ. වික්‍රමරත්න,
මාතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1970 ක්වූ මාර්තු මස 25 දින,
මාතර කච්චේරියේ දී ය.

4-874

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

**සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.**

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උප ලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මඟින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම යැවිය යුතුය.

## උපලේඛනය

## 1970

| මාසය | පළකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|
| මාර්තු ... | 70. 3. 5 බ්‍රහස්පතින්ද ... | 70. 2.27 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 3.13 සිකුරාද ... | 70. 3. 5 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70 3.20 සිකුරාද ... | 70 3.13 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 3.26 බ්‍රහස්පතින්ද . . | 70. 3.19 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| අප්‍රේල් ... | 70. 4 3 සිකුරාද ... | 70. 3.25 බදාද | ප.ව. | 3.30 |
| | 70. 4.10 සිකුරාද . . | 70. 4. 3 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 4.17 සිකුරාද ... | 70. 4. 8 බදාද | ප.ව. | 3.30 |
| | 70. 4.24 සිකුරාද ... | 70. 4.17 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 4.30 බ්‍රහස්පතින්ද ... | 70. 4.23 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| මැයි ... | 70. 5. 8 සිකුරාද . . | 70. 4.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 5.15 සිකුරාද .. | 70. 5. 8 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 5.22 සිකුරාද ... | 70. 5.15 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 5.29 සිකුරාද ... | 70. 5.22 සිකුරාද | ප.ව. | 3.30 |
| ජූනි .. | 70. 6. 5 සිකුරාද ... | 70. 5.29 සිකුරාද | ප.ව. | 3 30 |
| | 70. 6.11 බ්‍රහස්පතින්ද ... | 70. 6. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.18 බ්‍රහස්පතින්ද ... | 70. 6.11 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 6.25 බ්‍රහස්පතින්ද ... | 70. 6.18 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |

එල්. ඩබ්ලිව්. ඩී. සිරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1970 මාර්තු මස 5 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව. කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.